# ලක්දිව ප්‍රචලිත වූ සාහිත්‍ය ශාස්ත්‍රය හා අර්ථවිචාරය පිළිබඳ අදහස්

මහාචාර්ය විමල් ජී. බලගල්ලේ

1.0 මෙකල භාවිතය අනුව, සිංහලයෙහි සාහිත්‍ය ශබ්දය සාමාන්‍යයෙන් යෙදෙන අරුත් දෙකක් වේ. ''සාහිත්‍ය ඉතිහාසය'' වැනි තැන්හි බොහෝවිට එය යොදනු ලබන්නේ කිසියම් බසකින් රචිතව ඇති කාව්‍යමය වූත් නොවූත් සියලු නිබන්ධ වාච්‍ය වන අයුරිනි; ''සාහිත්‍ය කලාව'' ''සාහිත්‍ය රසාස්වාදය'', ''සාහිත්‍ය විචාරය'' වැනි තැන්හි එය යොදනු ලබන්නේ කලාත්මක රචනා හෙවත් කාව්‍යමය රචනා වාච්‍ය වන අයුරිනි. ඉහත, ''සාහිත්‍ය ශාස්ත්‍රය'' යන තැන්හි 'සාහිත්‍ය' ශබ්දය යෙදී ඇත්තේ ද මෙකී දෙවන අරුතෙහිය.

1.1 ඓතිහාසික වශයෙන් බලන විට කාව්‍යමය රචනා පර්යාය වූ මෙම සාහිත්‍ය ශබ්දය, සංස්කෘතයෙහි භාවිත වන්නට පටන් ගත්තේ, කාව්‍ය ශබ්ද භාවිතයෙන් බොහෝ කලකට පසුව බව පෙනේ. වචන රචන විශේෂණයක් වශයෙන් නැතහොත් වචන රචන පර්‍යායයක් වශයෙන් යෙදෙන ඒකීභූත යන අරුත් ඇති 'සහිත' ශබ්දයෙන් සිද්ධ තද්ධිතයක් වූ 'සාහිත්‍ය' ශබ්දයේ නිරුක්ත්‍යර්ථය ඒකීභාවය, සංගතභාවය නොහොත් සමවායීභාවය යනුයි. 'කාව්‍ය' ශබ්දයේ නිරුක්ත්‍යර්ථය කවියාගේ කෘතිය යනුයි. 'කවි' ශබ්දය වර්ණනාර්ථ 'කව්–'(√කවෘ වර්ණනෙ) ධාතුවෙන් සිද්ධ බව වෛයාකරණිකයෝ කියති. එහෙත් ඍග්වේද යුගයේදී 'කවි' සදින් සාමාන්‍යයෙන් අභිප්‍රෙත වූයේ 'පඬිවරයා' 'ඍෂිවරයා' වැනි අරුතකි. කලාත්මක නොහොත් වර්ණනාත්මක නිර්මාණ සඳහා කාව්‍ය ශබ්දය ව්‍යවහාරප්‍රාප්ත වූ අයුරු වාල්මීකීගේ රාමායණයෙන් ප්‍රථම කාව්‍යයේ උපත වූ හැටි කියන ජනප්‍රවාදයෙන් හෙළි වෙයි. සාහිත්‍ය ශබ්දයේ සම්භවයෙන් පසුව, සෞන්දරනන්ද, ජානකීහරණ වැනි පද්‍ය කාව්‍යත්, කාදම්බරි, හර්ෂචරිත වැනි ගද්‍ය කාව්‍යත්, ශාකුන්තල, රත්නාවලී වැනි දෘශ්‍ය කාව්‍යත් 'ශබ්ද–අර්ථද්වය පිළිබඳ මනා ඒකීයභාවය ඇත්තේ' යන අරුතින් එකට ගෙන, පොදුවේ හැඳින්වීම සඳහා වඩාත් සුදුසු වචනයක් වශයෙන් එය ක්‍රමයෙන් ව්‍යවහාර ප්‍රාප්ත වූ බව පෙනී යයි. එහෙත් එය ව්‍යවහාරයට පැමිණ කලක් ගත වන තෙක්ම ඇතැම් විචාරකයන් කාව්‍යාර්ථයෙහි ලා සාහිත්‍ය ශබ්දය යොදන්නට මැලි වූ සැටි, රුය්‍යකගේ (12 සියවස) සාහිත්‍ය මීමාංසායෙහි එන සාහිත්‍ය–කාව්‍ය විවරණයෙන් ගම්‍ය වේ. එම විවරණයට අනුව සාහිත්‍යය නම් වෘත්ති, විවක්ෂා, තාත්පර්ය, ප්‍රවිභාග, ව්‍යපේක්ෂණ සාමර්ථ්‍ය, අන්වය, ඒකාර්ථ්‍ය යන අෂ්ටකයේ සම්බන්ධය වන අතර, කාව්‍යයක් විමට නම් එම අෂ්ටකයට දෝෂත්‍යාග, ගුණාධාන, අලංකාර යෝග, රසාන්වය යන සාහිත්‍ය පරිෂ්කාර චතුෂ්කය ද එක්විය යුතුය.[1] එහෙත් භෝජයන්ගේ මතය මේ අංග 12 ම සාහිත්‍යයෙහි විය යුතු බවයි.[2] කෙසේ වෙතත් සාහිත්‍ය ශබ්දයේ ව්‍යවහාරය මෙහි කී පරිදි කාව්‍ය ශාස්ත්‍ර පාරිභාෂිකයක තත්ත්වයට පමණක් සීමා නුවූ බවට සාධක ඇත.

1.11 පාලි ත්‍රිපිටකාගත ''බහුම්පි චෙ සහිතං භාසමානො'' (ධම්මපද) ''කුසලො ච සහිතාසහිතස්ස'' (චුල්ලවග්ග) වැනි තැන්හි 'සහිත' ශබ්දය යෙදී ඇත්තේ 'සාහිත්‍ය' ශබ්දයේ ඉහත කී අරුතට බෙහෙවින් සමාන අරුතක් දෙන අයුරිනි. අනික් අතින් එය, ''ඍග්වේද සංහිතා'' ''මනු සංහිතා'' වැනි තැන්හි එන 'සංහිතා' ශබ්දයේ අරුතට ද

සමීප වන බවක් පෙනේ. මේ හැරුණු විට, සාහිත්‍ය ශබ්දයේ පැරණිතම යෙදුම් සේ ගත හැකි නිදසුන් කීපයක් කාත්‍යායන ශ්‍රෞත සූත්‍ර කාමන්දකීය නීතිසාර යන ග්‍රන්ථ යන්හි දක්නට ඇතත්, ඒවා යෙදී ඇත්තේ හුදෙක්, එක්ව පැවැත්ම, නැතහොත් එකතුව යන අරුතිනි.

1.12 සංස්කෘතයෙහි නිසැක ලෙසම කාව්‍යනිර්මාණාත්මක වූ සාහිත්‍ය ශබ්දයාගේ ප්‍රයෝගයක්, භර්තෘහරි කවියාගේ (ක්‍රි.ව. 600 පමණ) සුභාෂිත රචනා අතුරෙහි එන පහත සඳහන් පද්‍යයෙහි දක්නට ලැබේ:

''සාහිත්‍ය සංගීත කලා විහීනඃ
සාක්ෂාත් පශුඃ පුච්ඡ විෂාණ හීනඃ
තෘණං න ඛාදන්නපි ජීවමානඃ
තද් භාගධෙයං පරමං පශූනාම්''[3]

[සාහිත්‍ය සංගීත (ආදී) ලලිත කලාවන් පිළිබඳ නිර්මාණ පරිශීලනයන්ගෙන් තොර වූ මිනිසා අං හා වලිගය නැති ප්‍රත්‍යක්ෂ හරකෙකි. ඔහු සිය දිවිපැවැත්ම සඳහා තණ කොළ නොකා සිටීම හරකුන්ගේ පරම භාග්‍යය යි]. මෙසේ ම කාලිදසගේ (6 සියවස) වික්‍රමෝර්වශීයෙහි ද, මුකුලභට්ටගේ (10 සියවස) අභිධාවෘත්ති මාතෘකාවෙහි ද ප්‍රතීහාරේන්දුරාජගේ (11 සියවස) ලඝුවෘත්ති නම් කාව්‍යාලංකාර සාරසංග්‍රහ ටීකාවෙහි ද භෝජගේ (11 සියවස) ශෘඞ්ගාර ප්‍රකාශාදියෙහි ද කාව්‍යාර්ථ සාහිත්‍ය ශබ්දය යොදු තිබේ. 11 සියවසේ පටන් සාහිත්‍ය ශබ්ද ව්‍යවහාරය බෙහෙවින් ජනප්‍රිය විය.[4]

1.13 සාහිත්‍ය ශබ්ද ඉතිහාසයෙහි ඊළඟ පියවර වූයේ කාව්‍යමය නිර්මාණ පමණක් නොව කාව්‍යශාස්ත්‍රය හෙවත් සාහිත්‍ය විද්‍යාව හැඳින්වීමට ද එය යොදන්නට වීමයි. ක්ෂේමේන්ද්‍ර කවියාගේ (11 සියවස) වෘහත් කථා මඤ්ජරියෙහි එන ''ශ්‍රුත්වාභිනව ගුප්තාඛ්‍යාත් සාහිත්‍යං බෝධ වාරිධෙඃ'' [අභිනව ගුප්ත නම් ප්‍රඥා සාගරයා වෙතින් සාහිත්‍ය විද්‍යාව ඉගෙන] යන පාඨයෙහි ''සාහිත්‍යම්'' යන්න යෙදී ඇත්තේ සාහිත්‍ය විද්‍යාව යන අරුතිනි. කාව්‍යමීමාංසාකාර රාජශේඛර (ක්‍රි.ව. 900 පමණ) කවියා එම අරුත දීමට සාහිත්‍ය විද්‍යා යන සමාස පදයම යොදයි. කාව්‍යමීමාංසාවේ එන 'කවිරහස්‍ය' පුරාවෘත්තයට අනුව, සරස්වතී පුත්‍ර වූ කාව්‍යපුරුෂයාගේ පත්නිය වන්නී සාහිත්‍ය විද්‍යාව යි. (මෙම පුරාවෘත්තය පසුව කෙටියෙන් දක්වනු ලැබේ.) මින්පසු මේ අරුතෙහි වැඩිවශයෙන් එය යෙදී ඇත්තේ විද්‍යා, ප්‍රකාශ, මීමාංසා, දර්පණ ආදී වචනයක්, විශේෂයෙන් උත්තර පදයක්, සමග බව සාහිත්‍ය විද්‍යා (රාජශේඛරගේ කාව්‍යමීමාංසාවෙහි) සාහිත්‍ය ප්‍රකාශ (භෝජගේශෘඞ්ගාර ප්‍රකාශයෙහි, 11 සියවස මුල) සාහිත්‍ය මීමාංසා (රුය්‍යක, 12 සියවස), සාහිත්‍ය දර්පණ (විශ්වනාථ 14 සියවස), සාහිත්‍ය චින්තාමණි (වේමභූපාල, 15 සියවස), සාහිත්‍ය චූඩාමණි (ගෝපාලභට්ට, 15 සියවස?), සාහිත්‍ය කල්පද්‍රුම (රාජශේඛර), සාහිත්‍ය කෞමුදී (I අර්කසූරි, II විද්‍යාභූෂණ), සාහිත්‍ය දීපිකා (භාස්කරමිශ්‍ර), සාහිත්‍ය බෝධ (සීතාරාම), සාහිත්‍ය මංජූෂා (දජී), සාහිත්‍ය රත්නාකර (ධර්මසූරි), සාහිත්‍ය විලාස (චතුර්භුජ), සාහිත්‍ය සංග්‍රහ (ශම්භුදස), සාහිත්‍ය සර්වස්ව (මහේශ්වර), සාහිත්‍ය සාර (I සර්වේශ්වර, II මානසිංහ), සාහිත්‍ය සුධා (නේමිසාහ), සාහිත්‍ය සුධාසින්ධු (විශ්වනාථ), සාහිත්‍යාබ්ධි (වේණිදත්ත) යන යෙදුම් හෝ ග්‍රන්ථ

නාමවලින් ප්‍රකට වෙයි. තවද යථොක්ත ග්‍රන්ථ අතුරින් විශ්වනාථ ප්‍රණීත සාහිත්‍ය දර්පණය එය ලියවුණු කාලයේ සිටම බෙහෙවින් ප්‍රචලිත වූ කවි ජනප්‍රිය කෘතියක් වූ බවත්, කාව්‍ය ශබ්දය අභිභවා සාහිත්‍ය ශබ්දය ජනප්‍රිය වීම කෙරෙහි එයද ප්‍රාසංගික වශයෙන් හේතු වූ බවත් පෙනේ.

1.14 ශබ්දර්ථ දෙදෙනාගේ සම්මිලිතභාව සංඛ්‍යාත අර්ථය හා බැඳුණු 'සාහිත්‍ය' **ශබ්දය** කාව්‍යය හැඳින්වීම සඳහා ව්‍යවහාර ප්‍රාප්තවීමට භාමහ (8 සියවස?) ගේ ''ශබ්දර්ථෞ සාහිතෞ කාව්‍යම්'' යන කාව්‍යලංකාර සූත්‍රය (කා.සූ. 2, 16) මුල් වූ බවක් ද කියනු ලැබේ. රුද්‍රට (9 සියවස) කාව්‍යය හැඳින්වූයේ ''ශබ්දාර්ථෞ කාව්‍යම්'' යනුවෙනි. කාව්‍යාදර්ශයේ ''ශරීරං තාවදිෂ්ටාර්ථව්‍යවච්ඡින්නා පදාවලී'' යන්නත්, සියබස් ලකරේ ''කැමතිය අත් දක්වූ වදන් පබඳෙහි සිරුර'' යන්නත් භාමහෝක්තියට අනුකූල වෙයි. එහෙත්, ශබ්දර්ථ දෙදෙනගේ ඒකීයභාවය කවර පබඳක වුවද අවිශේෂ ලක්ෂණයක් බව පිළිගැනුණු හෙයින්, පසුව එම කාව්‍ය නිර්වචනයට විශේෂණ එකින් එක එක්වූ සැටි, ''කාව්‍යශබ්දෙයං ගුණාලංකාර සංස්කෘතයොඃ ශබ්දර්ථයොර්වර්තතෙ'' (වාමන, ක්‍රි.800 පමණ), ''ශබ්දර්ථෞ සහිතෞ වක්‍ර – කවිව්‍යාපාරශාලිනි, බන්ධෙව්‍යවස්ථිතෞ කාව්‍යං–තද්විදහ්ලාදකාරිණී'' (කුන්තක, 10 සියවස), ''මුඛ්‍යයා තාවද් ගුණසංස්කෘත ශබ්දර්ථශරීරමෙව කාව්‍යම්'' (ප්‍රතීහාරෙන්දුරාජ, 11 සියවස), ''තදදෙෂෞ ශබ්දර්ථෞ සගුණාවානලංකෘතී පුනඃ ......'' (මම්මට, 11 සියවස) ''අදෙෂෞ සගුණෞ සාලංකාරෞච ශබ්දර්ථෞ කාව්‍යම්'' (හේමචන්ද්‍ර, 12 සියවස), ''ශබ්දර්ථෞ නිර්දෙෂෞ සගුණෞ ප්‍රායඃ සාලංකාරෞච කාව්‍යම්'' (වාග්භට 12 සියවස) වැනි පාශ්චාත්‍යයන්ගේ කාව්‍යශබ්දර්ථ විවරණයන් දෙස බැලීමේදී පැහැදිලි වේ.

1.2 සිංහලයෙහිද සාහිත්‍ය ශබ්දය මුලදී යෙදී ඇත්තේ යටකී කාත්‍යායන ශ්‍රෞත සූත්‍රාදියෙහි මෙන් එක්ව පැවැත්ම, සංගතිය නොහොත් සමූහය යන සාමාන්‍ය අර්ථයෙන් බව ''විවිධාශ්චර්‍ය්‍ය **සාහිත්‍යයෙන්** අඥාන රාහිත්‍යයෙන්'' (දහම්සරණ 12 සියවස)[5] වැනි පාඨයන්ගෙන් පෙනේ. කාව්‍යාදර්ශ අනුවාද මුඛයෙන් ලියවුණු සිංහල කාව්‍ය ශාස්ත්‍රීය ග්‍රන්ථයක් වූ සියබස් ලකරෙහි කාව්‍යයත් කාව්‍ය ශාස්ත්‍රයත් සඳහා යොදා ඇත්තේ 'කව්' හා 'කව්ලකුණු' වැනි වචනයි.

1.21. 13–16 සියවස් තුළ ලියවුණු සිංහල පොත් කීපයකම උපාධි/විරුද නාමයක් වශයෙන් නැතහොත් උපාධි/විරුද නාමයක කොටසක් වශයෙන් සාහිත්‍ය ශබ්දය යෙදී තිබේ.

1. ''කලිකාල **සාහිත්‍ය** සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු'' (කඳවුරු සිරිත)[6]
2. ''නැම්බඹර කලිකාල සංගීත **සාහිත්‍ය** සර්වඥපණ්ඩිත පරාක්‍රමබාහු'' (දඹදෙණි අස්න)[7]
3. ''කලිකාල **සාහිත්‍ය** සර්වඥ කුලාදිත්‍ය පණ්ඩිත පරාක්‍රමබාහු'' (දළදා පූජාවලිය)[8]
4. ''කලිකාල **සාහිත්‍ය** සර්වඥපණ්ඩිත පරාක්‍රමබාහු'' (නිකාය සංග්‍රහ[9]/සද්ධර්ම රත්නාකර)[10]
5. කලිකාල **සාහිත්‍ය** සර්වඥපණ්ඩිත පරාක්‍රමබාහු මහරජාණෝ'' (රාජරත්නාකර)[11]
6. ''ශ්ලෝක සිද්ධාර්ථය, **සාහිත්‍ය** විල්ගම්මුලය, මයූරපාදය'' (නිකාය සංග්‍රහ)[12]
7. ''ශ්ලෝක සිද්ධාර්ථය, **සාහිත්‍ය** විල්ගම්මුලය, අනුරුද්ධය'' (සද්ධර්මරත්නාකර)[13]
8. ''ධර්මකීර්තිය, **සාහිත්‍ය** විල්ගම්මුලය, මයූරපාදය'' (රාජරත්නාකර)[14]

ඉහත කී නිදසුන් සියල්ලම ප්‍රකරණ සම්බන්ධය අනුව ගණ 3 කට වැටෙයි. (අ) 1,3,4,5 එක්ගණයකට ද (ආ) 2 තවත් ගණයකට ද, (ඇ) 6,7,8 තවත් ගණයකට ද වශයෙනි. මෙයින් (ආ) හැර ඉතිරි සියලු තන්හි, එනම් අ,ඇ, දෙගණයට අයත් නිදසුන්හි සාහිත්‍ය ශබ්දයට වැඩියෙන් ම ගැළපෙන්නේ මෙම ලිපියේ ආරම්භයෙහි දක්වූ වඩා පුළුල් අරුත යි. (ආ) 2 නිදසුනට ද එම අරුත ගැළපෙන නමුත්, ඒ හා යෙදුණු සංගීත ශබ්දය නිසා සාහිත්‍ය ශබ්දයෙනුදු කාව්‍යමය නිර්මාණ යන අරුත අභිප්‍රෙත වන බවක් හැඟීයයි. කෙසේ වුවද එබඳු අර්ථකථනයක් කළ හැක්කේ මෙය සාම්ප්‍රදායික උපාධිනාමයක් වශයෙන් නොව පුද්ගලික විරුද නාමයක් වශයෙන් සලකත හොත් පමණි. මේ නිදසුන් එකකදී හෝ සාහිත්‍ය ශාස්ත්‍ර අර්ථය නම් අපේක්ෂිත බවක් නො පෙනේ.

1.22 එහෙත් පැරකුම්බා සිරිත (15 සියවස) සවන පැරකුම්බාවන්ගේ ගුණ වනමින් ''සකල කලා වල්ලබ ගුණ **සාහිත සත** බෝජරාජ''[15] යනුවෙන් සාහිත්‍ය ශාස්ත්‍රය ඉඳුරා සඳහන් කිරීමෙන් පෙනෙන්නේ සාහිත්‍ය ශබ්දය ඒ වනවිට සාහිත්‍ය ශාස්ත්‍ර හෙවත් කාව්‍යශාස්ත්‍ර අර්ථයෙනුදු ලක්දිව උගතුන් අතර ප්‍රචලිතව තිබුණු බවයි. පැරකුම්බා රජ සාහිත්‍ය ශාස්ත්‍රඥානයෙන් භෝජරජු වැනි වී යන උපමාව නිසා ඒ බව තව දුරටත් තහවුරු වෙයි. භෝජරජ (ක්‍රි.1005–1054) සරස්වතී කණ්ඨාභරණ හා ශෘඞ්ගාර ප්‍රකාශ යන සංස්කෘත සාහිත්‍ය ශාස්ත්‍ර ග්‍රන්ථයන්ගේ කතුවරයා ය. කෝට්ටේ යුගය වනවිට, ඔහුගේ අදහස් ලක්දිව සාහිත්‍ය ශාස්ත්‍ර සම්ප්‍රදාය තුළ බෙහෙවින් සම්භාවිතව පැවති බවක් ද යථොක්ත පද්‍යපාඨයෙන් ගම්‍ය වෙයි. රහල් හිමියන්ගේ පංචිකා ප්‍රදීපයෙහි භෝජ දේවයන්ගේ සරස්වතී කණ්ඨාභරණය නමින් ම සඳහන් වීමෙන්[16] එම මතයට තවත් රුකුල් ලැබේ. කෝට්ටේ යුගයේ පඬිවරුන් වියරණයෙහි මෙන්ම සඳලකරෙහි ප්‍රවීණයන් වූ බව ගිරා සන්දේශයෙහි එන විජයබා පිරිවෙන් හා රහල්හිමි වැනුමෙනුත්[17] හංස සන්දේශයෙහි එන පද්මවතී පිරිවෙන් හා වනරතන හිමි වැනුමෙනුත්[18] හෙළි වන අතර එකල පැවති උසස් පිරිවෙන්වල වියරණ සඳ ලකර ඉගැන්වීමේ දී අනුගමනය කරන ලද්දේ එකම සම්ප්‍රදායකට සීමා නොවී සම්ප්‍රදාය කීපයකට අයත් පොත්පත් තුලනාත්මකව ඉගැන්වීමේ ක්‍රමයක් බව ගිරාවේ විජයබා පිරුවන් වැනුමෙනුත්, හංසයේ පද්මවතී පිරුවන් වැනුමෙනුත්, කව්සේකරයේ 'සරසවිමඬු' වැනුමෙනුත්[19] හෙළි වෙයි.

1.3 සාහිත්‍ය ශාස්ත්‍රය පිළිබඳව ඉන්දියාවෙහි පහළ වූ මතිමතාන්තර කල් ගොස් හෝ නොගොස් ලක්දිව උගතුන් අතර ද පැතිර ගියබව නිශ්චය කිරීමට තුඩු දෙන මෙබඳු නිදසුන් රැසක් ඇත. බුදුගුණ ගී හා අනිසමුසු ගී ගැන කියන අටුවා හා වංශකථා පුවත් බ්‍රාහ්මී සෙල්ලිපි ගී, සීගිරි පද්‍ය ආදියෙන් අනුමෙය වන පරිදි ක්‍රිස්තු පූර්ව අවධිය තෙක් දිවෙන කවිපදබැඳුම් ඉතිහාසයක් ඇති ලක්දිව කවියන්ගේත් පඬිවරුන්ගේත් කාව්‍ය ශාස්ත්‍ර ඥානය 9 වන හෝ 10 වන සියවසේ ලියැවුණු සියබස් ලකරට හෝ එහි ගුරු පොත වූ කාව්‍යාදර්ශයට හෝ සීමාවීයයි සිතන්නට ඉඩක් නැත. සියබස් ලකර කාලය වන විට කාව්‍යාදර්ශය මෙරට ප්‍රචලිත කාව්‍යාලංකාර ග්‍රන්ථ අතුරින් වඩා සුබෝධ වූත් නිරවුල් වූත්, එනිසාම සමහරවිට, මූලික පාඨ්‍ය ග්‍රන්ථයක් වශයෙන් භාවිත වූත් පොත වන්නට ඇත. එම යුගයේ දී එය ලක්දිව පමණක් නොව දක්ෂිණ භාරතයේ ද ජනප්‍රිය ග්‍රන්ථයක් වූ බව 9 වන සියවසේ විසූ මෝසවර්ෂ නෘපතුංග නම් රාෂ්ට්‍රකූට රජු විසින් ''කවිරාජමාර්ග'' නමින් කර්ණාට බසට පෙරළීමෙන් ස්ඵුට වෙයි.[20] කාව්‍යාදර්ශය

සමීප කාලපරිච්ඡේදයක් තුළ දෙරටේ රාජකීයයන් දෙදෙනෙකු විසින් එම දෙරටේ ස්වභාෂාවන්ට පෙරළනු ලැබීමෙන් පිළිබිඹු වන පොදු පිළිගැන්මට හේතු වන්නට ඇත්තේ ඒ කාලයේ දෙරට අතර පැවති දේශපාලනමය වූත් සංස්කෘතික වූත් සම්බන්ධතා විය යුතුය.

සිංහල උගතුන් අතුරෙහි කාව්‍යාදර්ශයේ මෙම ජනප්‍රියතාව කලක් ගත වනතුරුම හීන නුවූ බව, දඹදෙණි සමයට අයත්යයි සැලකෙන කාව්‍යාදර්ශ පුරාණ සන්නයෙන් හෙළි වේ. 12 වන සියවසේදී කාව්‍යාදර්ශය ‘දණ්ඩියාලංකාරම්’ නමින් දෙමළ බසට නැඟීමත්[21] උදයාදිත්‍යාලංකාරම් නමින් කාව්‍යාදර්ශ සාර සංග්‍රහයක් කණ්ණඩ බසින්[22] ලිවීමත් දකුණු ඉන්දියාවෙහි ද කාව්‍යාදර්ශය කෙරෙහි වූ සැලකිල්ල ඒ වනතෙක් නොඅඩුව පැවැති බවට සාධකයි. එහෙත් සියබස් ලකර හේතු කොට ගෙන, ලක්දිව කාව්‍ය ශාස්ත්‍ර සම්ප්‍රදය කාව්‍යාදර්ශ මාර්ගයටම සීමාවීමක් නම් සිලු නොවීය. ඒබව අනුරපුර යුගයේ අවසන පටන් කෝට්ටේ යුගයේ අවසන තෙක් ලියවී ඇති අමාවතුර, සුලුකලිඟුදව, බුත්සරණ, කව්සිළුමිණ, මයුර සංදේශය, කාව්‍යශේඛරය, සැළලිහිණි සන්දේශය ගිරා සන්දේශය, ගුත්තිලය, හංස සන්දේශය වැනි ගද්‍ය පද්‍ය ග්‍රන්ථ පරීක්ෂාවෙන් කියවන විට පෙනීයයි. මහා බෝධිවංශ ගැටපදය, ධර්මප්‍රදීපිකාව, අභිධර්මාර්ථසංග්‍රහ සන්නය, විශුද්ධිමාර්ග සන්නය, විරිත සන්නය, පදසාධන සන්නය, රූපසිද්ධි සන්නය, පංචිකාප්‍රදීපය වැනි සිංහල ව්‍යාඛ්‍යාන ග්‍රන්ථවලින් හා ලාංකික පඬිවරුන් වියරණ සඳලකර අලළා ලියූ සිදත් සඟරාව, එළුසඳස් ලකුණ, සුබෝධාලංකාරය වැනි වෙනත් සිංහල, පාලි, සංස්කෘත ග්‍රන්ථයන්ගෙන්ද එබව තවත් තහවුරු වෙයි.

1.31 න්‍යාය ශාස්ත්‍රාගත ප්‍රමාණයන් අතුරෙන් එකක් වූ ආප්තවචන සංඛ්‍යාත ශබ්දයෙන් වාක්‍යාර්ථ ඥානය වන ආකාරය, නැතහොත් සර්වපුරුෂාර්ථ සිද්ධියට මුල් කරුණක් සේ සැලකුණු සම්‍යග්ඥානයේ එක් ප්‍රභේදයක් වූ අනුමානඥානයේ දී වචන මාර්ගයෙන් අර්ථප්‍රතීතිය වන ආකාරය පිළිබඳව සාංඛ්‍ය න්‍යාය වෛශෙෂික හා මීමාංසා දර්ශනිකයන් සමග කාත්‍යායන, නාගර්ජුන, අසංග, වසුබන්ධු, දිඩ්නාග, ධර්මකීර්ති ආදී බෞද්ධ දර්ශනිකයන් වාදී-ප්‍රතිවාදීන් වශයෙන් අන්‍යොන්‍ය චෝදනා පරිහාර ඉදිරිපත් කරමින් සියවස් ගණනක් මුළුල්ලේ ගෙනගිය දර්ශනික චින්තා හරඹයෙහි ආනුෂඞ්ගික ඵලයක් වශයෙන්, භාරතීය ව්‍යාකරණ ශාස්ත්‍රයට හා කාව්‍ය ශාස්ත්‍රයටත් අර්ථප්‍රතීති ස්වරූපය පිළිබඳ එම අදහස් වැද්ද ගත් සැටි පතංජලී, භරත, චන්ද්‍රගෝමීන්, භර්තෘහරි, භාමහ, වාමන, මණ්ඩනමිශ්‍ර, රුද්‍රට, ආනන්දවර්ධන, රාජශේඛර, අභිනවගුප්ත, භට්ට-නායක, කුන්තක, මහිමභට්ට, භෝජ, ක්ෂේමේන්ද්‍ර, මම්මට, රුය්‍යක, හේමචන්ද්‍ර, ජයදේව, වාග්භට, විශ්වනාථ, නාගේශභට්ට ආදීන් විසින් ලියා ඇති ව්‍යාකරණ හා කාව්‍යශාස්ත්‍රීය ග්‍රන්ථසමූහයෙන් හෙළිවෙයි. අනුරාධපුර යුගයෙහි පටන්ම ලාංකික පඬිවරුන් ලියූ පොත්වල ඉහතකී ඇදුරන් හෝ ඔවුන්ගේ කෘතීන් නම් විසින් හෝ උද්ධෘත පාඨ මාර්ගයෙන් ගෙන හැර දක්වන තැන් ස්වල්ප නොවේ.

2.1 කාව්‍යාදර්ශය අනුගමනය කරමින් සරසවිය සිහිපත් කොට ග්‍රන්ථාරම්භය කරන සියබස් ලකර කරුවා

> ‘‘මහබඹ සකා සුරඇජරා එකසුබු ඉසි
> පවර වාමන දඬි ඈ නැමද කව්ලකුණැජරන්’’

යන දෙවන ගීයෙන් පූර්වාචාර්ය නමස්කාරයක් කරයි. එම ගීයේ පසු අඩෙහි සඳහන් 'දඩි' නම් සියබස් ලකරේ ගුරුපොත වූ කාව්‍යාදර්ශය කළ දණ්ඩින් නම් කවියාය. 7 වන සියවසේ අගභාගයේදී ඔහු විසූබව සාමාන්‍ය පිළිගැනීම යි.[23] දණ්ඩින් කාව්‍යාදර්ශය පමණක් නොව ඡන්දශ්ශාස්ත්‍රීය ග්‍රන්ථයක් ද කළ බව ප්‍රසිද්ධයි. කව්ලකුණු ඇජරකු වශයෙන් දණ්ඩින්ට දඹදිවත් ලක්දිවත් පඬිවරුන් දැක්වූ සැලකිල්ල ගැන මා ඉහත සඳහන් කොට ඇත. සියබස් ලකර ඔහුගේ නමට මුලින් සඳහන් කළ වාමන නම් ක්‍රි.ව. 800 දී පමණ කාව්‍යාලංකාරසූත්‍ර නම් ග්‍රන්ථය ලියූ රීතිවාදියකු වශයෙන් ප්‍රසිද්ධ කාව්‍යලක්ෂණ ආචාර්යවරයෙකි. බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලයේ ඇති සියබස් ලකර අත්පිටපත් දෙකක ඉහත දැක්වූ ගීයේ ''වාමන'' යන්න වෙනුවට ''බාමහ'' යන්න ඇතිබව මහාචාර්ය බාර්නට් පෙන්වා දී තිබේ.[24] දැනට ලක්දිව මුද්‍රිතව ඇති සංස්කරණවල මෙතැන්හි වාමන යන්න දක්නට ඇතත් අත්පිටපත් සමහරක 'වාමන' වෙනුවට ඇත්තේ 'බාමහ' යන්නය.[25] 8 වන සියවසේ මුල විසූ භාමහ 'කාව්‍යාලංකාර' නම් ග්‍රන්ථයේ කතුවරයා ය.[26] දණ්ඩින් මෙන් ම භාමහ ද ශබ්දාලංකාරය අර්ථාලංකාරයෙන් වෙන්කොට විස්තර කරයි. ඒ හැර භාමහ බෞද්ධයෙක්ද විය. කෙසේ වුව ද සියබස්ලකර කතුවරයාගේ යෙදුම වාමන ද බාමහ ද යනු එහි ශාස්ත්‍රීය සංස්කරණයකදී නිශ්චය කළ යුත්තකි.

2.11 සියබස්ලකර කතුවරයා වාමන (හෝ බාමහ) දඩි යන කව් ලකුණු ඇජරන් සිහිපත් කිරීමට ද කලින්, එනම් එම ගීයේ පෙර අඩින් මහබඹ, ශක්‍ර, සුරාචාර්‍ය හෝ අසුරාචාර්‍ය, කසුබු ඉසි යන මොවුන් ද කව්ලකුණැජරන් වශයෙන් සිහිපත් කරයි. මෙහි කී සුරඇජරා හා කසුබුඉසි කෙසේ වෙතත්, පුරාණ දේවකථාගත චරිත වශයෙන් ප්‍රසිද්ධ වූ මහබඹා හෝ සකා හෝ මිනිස්ලොව කව්ලකුණැජරන් සේ සැලකීමට ඉඩක් නැත. එසේ නම් සියබස් ලකර ඔවුන් සිහිපත් කළේ දේවකථා නයින් හෝ කාව්‍ය ශාස්ත්‍රය සමග ඔවුන්ගේ ඇති කවර නම් සම්බන්ධයක් නිසාද? මේ හා සමාන්තර වූ කියමනක් කාව්‍යාදර්ශයෙහි නැතිඅතර, ඒ වෙනුවට එහි එන්නේ යටකී බ්‍රහ්මපත්නී සරස්වතියගේ ආරාධනයක් පමණි. එබැවින් සියබස්ලකර කරු කාව්‍යශාස්ත්‍රයේ දෛව ප්‍රභවය පැවසෙන ග්‍රන්ථාන්තරයන් ද පරිශීලනය කළබව සිතන්නට ඉඩ තීබේ.

2.12 අනුරාධපුර යුගයේ මුල් අවදියේ දී ඡන්දස අතින් මෙන්ම කව්ලකර අතින් ද සිංහල කවියෙහි දේශීය ලක්ෂණ බොහෝදුරට විද්‍යමාන විය. පොළොන්නරු හෝ දඹදෙණි යුගය වනතුරුත් ඡන්දසෙහි එම දේශීය ලක්ෂණ රැකුණු බව එළුසඳැස් ලකුණෙන් මෙන් ම සියබස් ලකරේ එන කලාගුරු සුලුපා වැසිවූ කලණමිත් වියතුන් කළ සඳස් ගත්හි මැ පෙළින් ද[27] මෙතෙක් නොනට සීගිරිගී ඇතුළු පද්‍යරචනාවන්හි භාවිත විරිත් රැසින් ද හෙළි වෙයි. හෙළසඳස් ආරෙහි එම ස්වරූපය කැපී පෙනෙන අයුරින් වෙනස් වන්නට පටන් ගත්තේ කෝට්ටේ යුගයෙහි පමණ පටන්ය. එහෙත්, හෙළවියතුන් අතර ජානකීහරණ කාර කුමාරදසයන් (6 සියවස) වැනි සකුකව්සතර කෙළපත් කවියන් පහළ වූ යුගය වන විට එහි බලපෑමට හෙළකව්මග ද ඇතුළු ලක්දිව සමස්ත කවිසම්ප්‍රදයම සුලුවශයෙන් හෝ ලක්ව පැවති බව සිතිය හැකිය.

2.13 භරතමුනි (3 සියවස?) ප්‍රණීත නාට්‍යශාස්ත්‍රයේ එන නාට්‍යවේද පුරාවෘත්තයට අනුව කාව්‍යශාස්ත්‍රය ද ඇතුළු නාට්‍ය ශාස්ත්‍රය පංචමවේදය වශයෙන් සැලකෙන අතර එහි ප්‍රණේතෘත්වය මහාබ්‍රහ්මයාට පැවරේ. නාට්‍ය ශාස්ත්‍ර ප්‍රථම අධ්‍යායෙහි දැක්වෙන පරිදි, ආත්‍රෙයාදි මුනිවරුන් විසින් විමසන ලද භරතමුනි නාට්‍යශාස්ත්‍රයේ උපත පැවසුයේ මෙසේය: ''පෙර ශක්‍රාදි දෙවිවරු ශුද්‍රයන්ද ඇතුළු සර්වවර්ණයන්ට පොදුවූ පස්වන

වේදයක් නිර්මාණය කරන ලෙස බ්‍රහ්මයාගෙන් ඉල්වූහ. ඉල්ලීම පිළිගත් බ්‍රහ්මයා චතුර්වේදඞ්ග සම්භව වූ නාට්‍ය වේදය නිර්මාණය කොට, ඉක්බිති ශක්‍රයාගේ ඉල්ලීම අනුව, එහි උද්ග්‍රහණ ධාරණ ප්‍රයෝගය [භරත නම්වූ] මට භාර කෙළේය. මම එය මගේ ශිෂ්‍ය පුත්‍රයන් සියයට ඉගැන්වීමි.[28]''

'වාචිකාභිනය' විවරණයෙහි ලා නාට්‍යශාස්ත්‍රයේ 15,16,17 පරිච්ඡෙද වලින් වෘත්ත විභාගාදී ඡන්දශාස්ත්‍රීය කරුණු හා අලංකාර දෝෂ ගුණාදී අලංකාර ශාස්ත්‍රීය කරුණුත්, එහි 6,7 පරිච්ඡෙදවලින් රසභාව විභාගාත්මක කරුණුත් විස්තර වන හෙයින් මෙන්ම නාට්‍යය කාව්‍ය ප්‍රභෙදයක් (=දෘශ්‍ය කාව්‍ය) සේ සැලකෙන හෙයිනුත් මහබඹු කාව්‍යශාස්ත්‍ර-ප්‍රණේතෘ වශයෙන් ගැනීම යුක්ති යුක්තය. ඒ සඳහා මහබඹුට ආයාචනය කළ 'ශක්‍රාදී දෙවිවරු' ද එහෙයින් ම කාව්‍ය ශාස්ත්‍ර ග්‍රන්ථකාරයන්ගේ ගෞරවයට සුදුස්සෝ වෙති.

2.14 රාජශේඛර (9 සියවස අග) ප්‍රණීත කාව්‍යමීමාංසාවේ එන පුරාවෘත්තයකින් කාව්‍යශාස්ත්‍ර ප්‍රණේතෘත්වය පැවරෙන්නේ ශිවදෙවියාට ය. එහි එන අරුත්පිරි කමනීය රූපකයක්වූ 'කවිරහස්‍ය' පුරාවෘත්තය අනුව ශිවදෙවියා බ්‍රහ්ම, විෂ්ණු ඇතුළු සිසුන් 64 දෙනෙකුට ඉගැන්විය. ඉක්බිති මහ බඹා තමාගේත් සරස්වතියගේත් පුත්‍ර කාව්‍යපුරුෂ ප්‍රමුඛ වූ මනස් පුත්‍රයන් ඇතුළු අතවැසි පිරිසට උගන්වා එම කාව්‍ය විද්‍යාව මනුලොව ප්‍රයෝජනය සඳහා ප්‍රවර්තනය කිරීමේ කාර්යභාරය ද සියලු සමය දත් කාව්‍යපුරුෂ වෙත පැවරීය. හෙතෙම ශක්‍ර සුරාචාර්ය ඇතුළු ශිෂ්‍යාධුනිකයන්ට කොටස් 18 කින් යුත් කාව්‍ය විද්‍යාව උගන්වා, එහි එක් එක් කොටසක් රැක ගැනීමේ වගකීම ද බෙද භාර-දුන්නේය. මේ අනුව කවිරහස්‍යය භාරවූයේ සහශ්‍රාක්ෂ හෙවත් ශක්‍රයාට ය. සුරා-චාර්යයාට භාර වූයේ දෝෂාධිකරණයයි. ශක්‍රයාට භාරවූ කවිරහස්‍යය ලොවට හෙළි වූයේ ද සුරාචාර්යයාගේ මාර්ගයෙනි. ඔහුගේ සිසුන් ඔහු කථාවට අල්වා ගැනීමෙනි කවිරහස්‍යය දැනගෙන ඇත්තේ.

කෙටියෙන් එම කවිරහස්‍යය මෙසේය: බ්‍රහ්මභාර්යාවූ සරස්වතී පුතකු පතා හිමගිරට වී තපස් කොට මහබඹුගෙන් පුත්‍රවරය ලබාගත්තාය. එහි ප්‍රතිඵල වශයෙන් ලැබුණු පුත්‍රයා යි පසුව කාව්‍යපුරුෂ නම් වූයේ. උපන් ඇසිල්ලෙහි දෙපයින් නැගී සිටි ඔහු,

''යදේතද් වාඞ්මයං විශ්වමර්ථමූර්ත්‍යා විවර්තතෙ,

සොස්මි කාව්‍යපුමානම්බ පාදෞ වන්දෙය තාවකෞ''

යන ප්‍රථම ඡන්දෙබද්ධ පද්‍යයෙන් සිය මවු ඇමතීය. මව මහත් ප්‍රීතියෙන් පෙරළා සිය පුතු අමතා මෙසේ කියයි: ''පුත, නුඹ ඡන්දෝබද්ධ වචනයෙන් කථා කිරීමෙන් නුඹේ මව වූ වචනාධිපති (සරස්වතිය) වූ මාද ජයගන්නෙහිය. මින් පෙර විද්වත්හු ගද්‍යය මිස පද්‍යය නොදත්තෝය. අදින් පසු ඡන්දස්වත් වචනය ලොව පැතිරෙන්නේය. ප්‍රශංසනීයයි! නුඹේ සිරුර නිර්මිත වූයේ ශබ්දර්ථ දෙකෙනි......රසය නුඹේ ආත්මය යි. නුඹ සම, ප්‍රසන්න, මධුර, උදර හා ඕජස්වීද වන්නෙහිය. ඡන්දස නුඹේ රෝමයෝයි. අනුප්‍රාස උපමාදීහු නුඹේ අලංකරණයෝ යි. අනාගතයෙහි වේදවාක්‍ය නම් වූ ශ්‍රැතිය පවා ''චත්වාරි ශෘඞ්ගා ත්‍රයො අස්‍ය පාද'' (ඍ.සං. 3.8.10) යනාදීන් නුඹට ස්තුති කරන්නීය. එහෙත් දැන්ම පුතා වැඩිහිටියකු මෙන් නොහැසිරී ළදරුවකු මෙන් හැසිරෙන්න.'' මෙසේ කියා පුතු රුක් සෙවනක ගල්තලාවක් මත තබා සරස්වතී අහස්ගඟට නාන්ට ගියාය. ඒ අතර දර කුසතණ ආදිය සොයා ගිය ශුක්‍රාචාර්ය, සෙවන ඉවත්වීම නිසා හිරුරැසින් පෙළෙන ළදරුවා දැක මොහු කාගේ දරුවෙක්දැයි සිතමින් සිය අසපුවට

ගෙන ගියේය. ඉන් සැනසීමට පත් සාරස්වතේය (=සරසවිය ගේ පුතා) ඡන්දස්වත් පද්‍යයකින් සිය මවු සරස්වතිය බව පළකොට සිකුරුට ද කවිත්වවර ප්‍රදනය කළේය. එතැන් පටන් සිකුරුට 'කවි' යන නම ලැබුණි. කාව්‍යය හා ඒකරූපී බැවින් සාරස්වතේය ද 'කාව්‍යපුරුෂ' නම් වී. නාගෙන පෙරළා පැමිණි සරස්වතී පුතු නොදැක, හදවතින් ශෝකය උතුරුවා අඬමින් ඔහු සොයා ඇවිදින්නට වූවාය. ප්‍රසංගයෙන් ඇයට වාල්මීකී මුනි හමුවූ කල්හි, ඔහු සිදු වූ පුවත කියා සිකුරු අසපුවද දැක්වී. සරස්වතී පුතු වඩාගෙන හිස සිඹිමින් හදවතින් උතුරා යන ප්‍රීතිය ඡන්දස්වත් වදනින් පළකොට, වාල්මීකීහුට කිවිවදන් පහළවේවා යිද පැතුවාය. ඉක්බිති එතැනින් ඉවත්ව යන වාල්මීකී ද වැද්දකු විසින් කාමමෝහිත අවස්ථාවක නසන ලද සහචරිය උදෙසා වැලපෙන ක්‍රෞංචයකු දැක,

''මා නිෂාද ප්‍රතිෂ්ඨාං ත්වමගමඃ ශාස්වතී සමාඃ
යත් ක්‍රෞංචමිථුනාදේකමවධීත් කාමමෝහිතම්''

යන ශෝකවත් ශ්ලෝකය පැවසීය. ඒ ඇසූ සරස්වතී ''වේදධ්‍යයනයෙහි නොනියැලෙන යමෙක් පළමු කොට මෙම ශ්ලෝකය පරිශීලනය කළේ නම් ඔහුද සරස්වතියගේ අනුග්‍රහය ලැබූ කවියෙක් වන්නේය''යි වරප්‍රදනය කළාය. පසුව වාල්මීකී රාමායණය රචනා කළේය. ද්වෛපායන (ව්‍යාස) ද පළමුව යථෝක්ත ශ්ලෝකය හැදෑරීමෙන් කවියකු වී මහාභාරතය රචනා කළේය.

බ්‍රහ්මර්ෂීන් හා දෙවියන් අතර විවාදයක් ඇතිවූ පසුදිනෙක මහබඹා එම විවාද විනිශ්චය සරසවිට භාර කළේය. කාව්‍යපුරුෂ ද ඈ සමග එන්නට සැරසෙන බව දුටු ඈ මහබඹුගේ අනුමතිය නැතිව ඔහුට බඹලොව යා නොහැකි බව කියා බලෙන් ඔහු නවතා පිටත් වූවාය. කාව්‍යපුරුෂ ද තරහෙන් නික්ම සිය මිතුරු කඳකුමරු වෙත ගියේය. කඳකුමරුගේ මව වූ ගෞරීදේවි ඔහු සනසා ''සත්වයන්ට ප්‍රේමබන්ධනය හා සමාන තවත් බන්ධනයක් නැති හෙයින් මොහු සිත් වශීකර ගත හැකි කාන්තාවක් මවමි''යි සිතා 'සාහිත්‍ය විද්‍යා' කාන්තාව මවා, ''මේ යන්නේ ඔබේ ස්වාමිපුරුෂයා යි. ඔහු තරහෙන් නික්ම යන නිසා පසුපස ගොස් නවත්වා ගන්න''යි නියම කළාය. ශිෂ්‍යමුනිහුද කාව්‍යපුරුෂ–සාහිත්‍ය විද්‍යා සමාගමය පිළිබඳ තුතිවදන් කියමින් ''අනාගතයෙහි මෙය අපට කාව්‍ය සර්වස්වය වන්නේය''යි කාව්‍යපුරුෂ පෙරදැරිව යන සාහිත්‍ය විද්‍යාව සමඟ දඹදිව පුරා චාරිකාව ඇරඹූහ. මගධාදී ඒ ඒ දේශයේ දී ඒ ඒ දෙසට අයත් මාගධී ආදී ගති, වෘත්ති, ප්‍රවෘත්ති ද ඒ ඒ දේශයෙහි ව්‍යවහෘත ගෞඩී ආදී රීතිද අනුව හැඩගැසෙමින් ගිය කාව්‍ය පුරුෂයාත් සාහිත්‍ය විද්‍යාවත් අවසානයේදී වෛදර්භ දේශීය වත්සගුල්ම නගරයට සැපත් වූහ. එහිදී චාරිකාව නැවැත්වූ කාව්‍යපුරුෂ තෙමේ සාහිත්‍යවිද්‍යාව පරිණයනය කොට ගෙන ඇයද සමග ආපසු හිමගිර බලා ගියේය. එහිදී එම කාව්‍ය–විද්‍යා යුවලට උමා සරසවි දෙදෙනාගේ ආශීර්වාදය ලැබිණ.[29]

2.15 මෙම කාව්‍යරහස්‍ය වෘත්තාන්තය අනුව වුවද මනුලොව කවිසත ඇදුරන් ශිවදෙවියා අමතක කොට මහබඹු කාව්‍යශාස්ත්‍ර ප්‍රණේතෘ වශයෙන් සැලකීම අසාධාරණයයි කිව නොහැකිය. කාව්‍යශාස්ත්‍රය මනුලොව පැතිරීම හා කෙළින්ම සම්බන්ධ වන්නේ ඔහු වන හෙයිනි. බඹහු සැමරීමෙන් සකලවිධ වචනයට ඉසුරු වූ වාග්දේවිය හෙවත් සරසවියත්, කවිය ලොවට පහළ කළ කාව්‍යපුරුෂත් නිතැතින්ම සැමරෙති.

2.21 ඉහතකී සියබස්ලකර ගීයෙන් සැමරෙන කසුබු ඉසි කවුදැයි පුරාණ සන්නකාර රත්නමධුපාදයන් ද ඇතුළු ව්‍යාඛ්‍යාතෘන් හරිහැටි හැඳින ගත් බවක් නොපෙනේ.

ඔහු යටකී පරිදි, එම නමට මුලින් කියවෙන දේවකථාගත බ්‍රහ්මාදීන් සමග සම්බන්ධ කොට දේවර්ෂියකු සේ සැලකිය යුතු ද, නැතහොත් අගින් කියවෙන භාමහාදී ඓතිහාසික පුද්ගලයන් සමග සම්බන්ධ කොට කාව්‍යාලංකාර ග්‍රන්ථකාර ආචාර්යවරයකු සේ සැලකිය යුතුද යනු මෙහිලා පැන නගින පළමුවන ප්‍රශ්නයයි. දේවකථාවල එන කාශ්‍යප ඍෂීන් අතුරෙන් එකෙකි බ්‍රහ්මපුත්‍ර මරීචි ඍෂිහුගේත් කර්දමදුහිතෘ කලාවගේත් පුත්‍ර වූ කශ්‍යප ඍෂියා. වේදමන්ත්‍ර කාරක ඍෂිවරයකු වශයෙන් පාලියෙහි සඳහන් වන්නේද මොහු විය හැකිය (අභිධාන.112). යජුර්වේද, ශතපථබ්‍රාහ්මණ, ශ්‍රී භාගවත, මාර්කණ්ඩෙය පුරාණ ආදියෙහි ඔහු ගැන සඳහන් වෙයි. බ්‍රහ්ම අඞ්ගුෂ්ඨයෙන් උපන් දක්ෂ ප්‍රජාපතිහුගේ දූවරුන් අතුරෙන් 17 ක් (නැතහොත් 13ක්) ඔහුගේ බිරියෝ වූහ. 'කලා' පුත්‍රයකු වශයෙන් නිරූපිත ඔහුට කාව්‍ය ශාස්ත්‍රය සමඟ එක්තරා සම්බන්ධයක් ඇතත්, මෙතැන අභිමත වූයේ ඔහු නොවිය හැකිය.

2.22 පුරුෂොත්තම දේව ප්‍රණීත ත්‍රිකාණ්ඩශේෂයට අනුව කාශ්‍යප ගෝත්‍රික 'කණාද' මුනිද 'කාශ්‍යප' නමින් හැඳින්වේ. කණාද භාරතීය පරමාණු වාදයයි නම් ලද වෛශේෂික දර්ශනයේ ප්‍රණේතෘවරයා ය. ලක්දිව විසූ සකුබස හදළ බෞද්ධ ආචාර්යවරුන් වෛශේෂික ග්‍රන්ථ කියවූ බව විශුද්ධි මාර්ග සන්න පංචිකාප්‍රදීප ආදියෙන් පෙනේ. රහල් හිමියන්ගේ කාව්‍යශේඛරයෙහි එන තක්සලා සරසවිමඩු වැනුමෙහි[30] එන වේද වේදඞ්ග ෂඩ්දර්ශන ඇතුළු දීර්ඝ විෂයමාලාවෙහි ලා එය ද සඳහන් වෙයි.

"සුරගුරු ද කණසර – කපිල අක්පද මුනිවර
දින වියස ඉසිවර – දිනූ නුවණැති සේක මුනිවර

යන කාව්‍යශේඛර පද්‍යය[31] ද සුරගුරු, කපිල, අක්ෂපාද, ජින, ව්‍යාස යන මොවුන් සමග කණසර (=කණාද) මුනිවරයා සඳහන් කරයි. උන්වහන්සේගේ පංචිකාප්‍රදීපය "තදන්‍ය වූ කණභක්ෂාක්ෂචරණ (=කණාද—අක්ෂපාද) කපිලපතංජලිජිනජෛමිනිව්‍යාස ප්‍රභෘතීන්ගේ සර්වඥත්ව යෝගය ව්‍යවච්ඡෙද කෙරේනු යි"[32] යනුවෙන් යටකී ඍෂි නාමමාලාවට පතංජලි ජෛමිනි දෙනමද එක්කරන අතර කණාදගේ නම සඳහන් කරයි.

රහල් හිමියන්ගේ භක්තිමත් ශිෂ්‍යයකු බව පෙනෙන ගිරාසංදේශ කතුවරයා ගිරාවේ 240 වන පද්‍යයෙන් රහල් හිමියන්ගේ ඡන්දෝලංකාරඥානය උසස් ලෙස වර්ණනා කොට "තිවට **කසුබු ඉසි** සුරගුරු මෙන් නොමඳ" යනාදී ඊළඟ පද්‍යයෙන්, උන්වහන්සේ වචන සම්පත්තියෙන් බ්‍රහ්මය, කසුබුඉසිය, සුරගුරුය යන මොවුන් බඳුයයි පවසයි.[33] මේ තිදෙනම සියබස්ලකර ගීයේ නම්වැලට ද ඇතුළත් වූවෝ යි. කව්සේකර පද්‍යයෙහි හා පංචිකාප්‍රදීප පාඨයෙහි සඳහන් ඍෂිවරුන් සියලු දෙනාම (සුරගුරුද ඇතුළුව) ස්මෘති ශාස්ත්‍ර ප්‍රණේතෘන් හෝ ව්‍යාඛ්‍යාතෘන් සේ සලකන ඇතැම් වියත්හු ඔවුන් ඓතිහාසික පුද්ගලයන් සේ ද ගණනය කරත්. ගිරාපද්‍යයෙන් එබඳු ඉඩක් නොලැබෙතත්, ඇතැම් පඬිවරුන් කණසර කසුබුඉසි ලෙසින් ද සැලකූබව සිතීමට නම් ඉන් බාධාවක් නොවේ. එහෙත් කණාද ඔහුගේ වෛශේෂික සූත්‍ර මිස ඡන්දෝලංකාර පිළිබඳ ග්‍රන්ථයක් කළ බවක් අනුමාන කිරීමට සාධක නැත. වෛශේෂික සූත්‍රවල ශබ්දාර්ථඥානය පිළිබඳව කෙරෙන ඉගැන්වීම් මගින් කාව්‍යාර්ථානුභවයට දූරසම්බන්ධයක් ඇතත් ඔහු කව්ලකුණු ඇජරකු වශයෙන් බුහුමන් ලැබීමට එය කිසිසේත් ප්‍රමාණවත් නොවේ. සරසවියත් සඳලකරත් සමඟ ඇති ප්‍රකරණ සම්බන්ධය නිසා ගිරාපද්‍යයෙහි වුවද තර්කන්‍යාය ප්‍රණේතෘවරයකුට වඩා කාව්‍යශාස්ත්‍ර ප්‍රණේතෘවරයකුම අභිමතයයි සිතීම යුක්තියුක්තය.

2.23 ඇත්ත වශයෙන්, කාව්‍යශාස්ත්‍ර ප්‍රණේතෘවරයකු වශයෙන් ගිණිය හැකි පුද්ගලයෙක් භාරතීය කාව්‍යාලංකාර ඉතිහාසයෙහිදී අපට හමුවෙයි. කාව්‍යාදර්ශ හෘදයංගමා ව්‍යාඛ්‍යාව ඔහු ගැන කියන එක් ග්‍රන්ථයකි. එය 'පූර්වශාස්ත්‍රාණි සංහෘත්‍ය' යනුවෙන් දණ්ඩින් සඳහන් කරන පූර්වකාව්‍යශාස්ත්‍ර ග්‍රන්ථකාරක ආචාර්යවරයකු වශයෙන්, "පූර්වෙෂාං කාශ්‍යප වරරුචි ප්‍රභෘතීනාං ආචාර්යාණාං ලක්ෂණ ශාස්ත්‍රාණි සංහෘත්‍ය පර්යාලෝච්‍ය"[34] (පෙර වූ කාශ්‍යප වරරුචි ඈ ඇදුරන්ගේ කාව්‍ය ලක්ෂණ ග්‍රන්ථයන් පරිශීලනය කොට) යන අර්ථවිවරණයෙහි ලා කාශ්‍යප කෙනෙකු ගැන සඳහන් කරයි. මෙසේම කාව්‍යාදර්ශ ශ්‍රුතානුපාලිනී ව්‍යාඛ්‍යාවද මෙතැන්හිදී කාශ්‍යප බ්‍රහ්මදත්ත නන්දිස්වාමී යන මොවුන් දණ්ඩින්ට පූර්වයායී වූ කාව්‍ය ලක්ෂණාචාර්යවරුන් සේ නම්කරයි.[35] මෙකියන කාශ්‍යපර්ෂිගේ කාව්‍යලක්ෂණ ශාස්ත්‍රය අද දක්නට නැත. එහෙත්, අභිනව ගුප්ත අභිනවභාරතී නම් නාට්‍යශාස්ත්‍ර විවරණයෙහි ලා කාශ්‍යප ඍෂි භරත මුනිට ද කලින් විසූ ප්‍රාමාණික නාට්‍ය ශාස්ත්‍ර ග්‍රන්ථයක කතුවරයකු ලෙස හඳුන්වා දෙන අතර, ඔහුගේ කෘතියෙන් පද්‍ය රාශියක් නිදර්ශන වශයෙන් ද ඉදිරිපත් කරයි.[36] භරතගේ නාට්‍යශාස්ත්‍රයෙහි හා ඔහුගේ පූර්වගාමියකු වූ නන්දිකේශ්වරගේ භරතාර්ණවයෙහි මෙන්ම කාශ්‍යපගේ නාට්‍ය ශාස්ත්‍රයෙහි ද කාව්‍යශාස්ත්‍රය පිළිබඳ වූ වැදගත් ඉගැන්වීම් ඇතුළත් වූවාට සැකයක් නැත.

2.24 සංගීතරත්නාකරකාර ශාර්ඞ්ගදේව (12 සියවස) නාට්‍යශාස්ත්‍ර ප්‍රණේතෘවරයකු වශයෙන් කාශ්‍යප නම්කළ අතර, සංගීතරත්නාකර ව්‍යාඛ්‍යාතෘ කල්ලිනාථ කාශ්‍යපගේ කෘතියෙන් ශ්ලෝක කීපයක් උපුටා දක්වයි. සමහරවිට, පාණිනි සඳහන් කරන 'නටසූත්‍රයෙහි' කතුවරයකු වූ කෘශාශ්ව[37] මොහුම විය හැකිය. එසේ නැතහොත්, සංගීතරත්නාකරය කියන කාශ්‍යප වෘද්ධකාශ්‍යප දෙදෙනාගෙන් 'වෘද්ධ කාශ්‍යප' විය හැකිය. අග්නිපුරාණයද ඡන්දශ්ශාස්ත්‍රය පිළිබඳ ප්‍රාමාණිකයකු ලෙස කාශ්‍යප ඍෂි හඳුන්වයි. පිඞ්ගලමුනිද පූර්වතර ඡන්දෝලක්ෂණ ආචාර්යවරයකු වශයෙන් කාශ්‍යපගේ නම සඳහන් කොට ඇත. මෙසේ හෙයින් සියබස්ලකර සඳහන් කරන කසුබු ඉසි නම් භරත, පිංගල, මුනිවරුන්ටද, සමහරවිට පාණිනීටද කලින් ජීවත් වූ ප්‍රාමාණික ඡන්දශ්ශාස්ත්‍රීය – නාට්‍ය ශාස්ත්‍රීය ග්‍රන්ථකාරක ආචාර්යවරයකු වශයෙන් සම්භාවිත ඓතිහාසික පුද්ගලයකු වූ බව නිගමනය කිරීම සහේතුකය.

2.31 ලක්දිව කාව්‍යශාස්ත්‍ර සම්ප්‍රදාය ගැන විමර්ශනය කරන මෙහිදී උක්තස්ථානයෙහි ලා කාව්‍යාදර්ශ (පුරාණ) සන්නය දෙන අර්ථකථනය කෙරෙහි ද අවධානය යොමුකිරීම යෝග්‍යබව පෙනේ. කාව්‍යාදර්ශ පුරාණ සන්නය සියබස්ලකරින් මෑත භාගයට අයත් වුවද අඩුතරමින් 13 වන සියවස තරම් පැරණි බව නිශ්චය කළ හැකිය. යථෝක්ත කාව්‍යාදර්ශ පද්‍යයේ 'පූර්වශාස්ත්‍රාණි' යන්නට පුරාණ සන්නය අර්ථ කියා ඇත්තේ "රාමශර්මාදි වූ පූර්වාචාර්යයන් විසින් කරන ලද කාව්‍යලක්ෂණයන්[38]" යනුවෙනි. මෙසේම කාව්‍යාදර්ශයේ දෙවන පරිච්ඡේදයේ දී "පූර්වාචාර්යෛඃ" යන්නට "මේධාවී ශ්‍යාමදේවාදි වූ කාව්‍ය ලක්ෂණ කාරයන් විසින්"[39] යනුවෙන් අර්ථ දක්වා ඇත.

2.32 පුරාණ සන්නකාරයා හෘදයංගමාකාර අභිනවභාරතීකාරයන් කියන කසුබු ඉසිහුගේ කෘතිය නොදත්බඳුය. ඒ වෙනුවට රාමශර්මන් නිදසුන් කළේ එහෙයින් විය යුතුය. මේ කියන රාමශර්මන්ගේ කෘතිය ගැන 12 සියවසේ දී සංඝරක්ෂිත තෙරුන් විසින් රචිත 'සුබෝධාලංකාර' නම් පාලි කාව්‍යානුශාසනයෙහි ද සඳහන් වෙයි:

"රාමසම්මාද්‍යලංකාරා – සන්ති සන්තො පුරාතනා"[40]

[රාමශර්මාදීන් විසින් විරචිත වූ මනෝඥ වූ චිරන්තන කාව්‍යාලංකාර ග්‍රන්ථ ඇති නමුදු] යන කියමනින් රාමශර්මාලංකාරය එකල කවිප්‍රශස්ත කෘතියක් වූ බවද අනාවරණය වෙයි. මෙකියන රාමශර්මන් නම් කවරේද? සංස්කෘත අවන්තිසුන්දරී කථාවෙහි දණ්ඩින්ගේ මිතුරකු වූ රාමශර්මන් කවියකු ගැන සඳහනක් ඇත. 'අවන්තිසුන්දරී කථා' කර්තෘ කාව්‍යාදර්ශකාර දණ්ඩින්මය යනු විද්වතුන්ගේ සාමාන්‍ය පිළිගැනීම යි[41] අවන්ති සුන්දරී කථාන්තරය දණ්ඩින්ගේ ම තවත් ප්‍රබන්ධයක් වූ දශකුමාරචරිතයෙහි ද අතුරු කතාවක් සෙයින් එන්නකි. රාමශර්මන් ගැන මීට වඩා නිශ්චිත සාක්ෂ්‍යයක් අපට ලැබෙන්නේ භාමහගේ කාව්‍යාලංකාරයෙනි:

''නානා ධාත්වර්ථ ගම්භීරා – යමකව්‍යපදේශිනී
ප්‍රහේලිකා සාහ්‍යුදිතා – රාමශර්මාච්‍යුතෝත්තරෙ''[42]

[යමකයයි කියනු ලබන නානා ධාත්වර්ථ ගම්භීර වූ රචනා ප්‍රහේලිකා යයි රාමශර්මන් ගේ අච්‍යුතෝත්තරයෙහි ප්‍රකාශිතය] යනුවෙන් රාමශර්මන් ලියූ අච්‍යුතෝත්තර නම් කාව්‍යලක්ෂණ ග්‍රන්ථයක් ගැන භාමහ සඳහන් කරයි. ඔහුගේ තවත් කෘතියක් නම් අලංකාර වංශයයි.[43] රාමශර්මන්ගේ රචනා කාව්‍යාලංකාරයෙහි නිදසුන් වශයෙන් ද දී තිබේ. මෙකල ඔහුගේ කෘති නාමශේෂත්වයට පත්ව ඇත ද එකල ලක්දිව කාව්‍යශාස්ත්‍ර සම්ප්‍රදයෙහි සම්මානිත කෘතීන් අතුරෙහි ඒවා ද වූ බව පැහැදිලි ය.

2.33 කාව්‍යාදර්ශ සන්නය කියන මේධාවින් කව්ලකුණු ඇජරකු වශයෙන් අග්නි පුරාණයෙහි ද දැක්වෙයි.[44] භාමහ ද ඔහු ගැන සඳහන් කරයි:

''ත ඒත උපමා දෙෂාඃ සප්ත මේධාවිනෝදිතාඃ''[45]

[ඒ මේ උපමාදෝෂයෝ සත්දෙන මේධාවිහු විසින් කියන ලදහ] යනාදීන් ඔහුගේ ඉගැන්වීමක් වූ උපමා දෙස් සතක් නිදර්ශිත ය. ඔහුගේ ම තවත් ඉගැන්වීමක් ගැන

''සංඛ්‍යානමිති මේධාවිනොත්ප්‍රෙක්ෂාභිහිතා ක්වචිත්''[46]

යන කාරිකාර්ධයෙන් කියැවෙයි. රාජශේඛරගේ කාව්‍යමීමාංසාවෙහි 'මේධාවිරුද්‍ර' නමින් හැඳින්වෙනුයේත් මොහුම විය හැකිය. ඔහුත් කුමාරදස කවියාත් උපතින්ම අන්ධවූවන් බව රාජශේඛර කියයි.[47] පුරුෂෝත්තම දේවයන්ගේ ත්‍රිකාණ්ඩ ශේෂයට අනුව මේධාවිරුද්‍රයන්ට කාලිදසයයි නාමාන්තරයක් විය. ඒ එසේ නම්, එක් කලකදී ඔහු මේ රටේ කවිජනාදරයට පාත්‍රව සිටින්නට ඇත. පැරකුම්බා සිරිතෙහි ද සඳහන් වන,[48] කුමාරදස, කාලිදස දෙකවියන්ගේ දැඩි මිත්‍රත්වය පැවසෙන ලක්දිව ප්‍රචලිත ජනප්‍රවාදය ඇත විහිද ගිය මුල් ඇත්තක් බව මෙයින් පෙනේ. රුද්‍රට ප්‍රණීත කාව්‍යාලංකාරයේ ව්‍යාඛ්‍යාතෘ වූ නමිසාධු ද ''නනු දණ්ඩි මෙධාවිරුද්‍ර භාමහාදි කෘතානි සන්ත්‍යේවාලංකාර ශාස්ත්‍රාණි''[49] යනුවෙන් දණ්ඩි භාමහ දෙදනා සමග මේධාවිරුද්‍ර ද අලංකාර ශාස්ත්‍ර ග්‍රන්ථ රචකයන් ලෙස හඳුන්වයි. උපමා දෝෂ පිළිබඳ මෙධාවිමතයත් ඔහු විසින් නිදර්ශිත පද්‍යකීපයකුත් නමිසාධු උපුටා දක්වයි. මෙධා-වින්ගේ මෙකියන කෘතිය ද මෙකල අභාවප්‍රාප්ත වූවකි.

2.34 යටකී කාව්‍යාදර්ශ සන්නපාඨයෙහි එන අනික් පඬිවරයා වූ **ශ්‍යාමදේව** ද රාජ ශේඛරගේ කාව්‍යමීමාංසාවෙහි කාව්‍යලක්ෂණාචාර්යවරයකු වශයෙන් හඳුන්වා දී ඇත.[50]

එහෙත් ඔහුගේ කෘතියක් මෙකල දක්නට නැත. එබැවින් ඒ කාලයේ ලක්දිව විසූ ග්‍රන්ථකාරක ආචාර්‍යවරුන් පුළුල්වශයෙන් සංස්කෘත කාව්‍යශාස්ත්‍රීය ග්‍රන්ථ පරිශීලනය කළ බව විනා එකල රටතුළ සම්මතව පැවැති කාව්‍යශාස්ත්‍ර සම්ප්‍රදායේ ස්වරූපය පිළිබඳව වැඩි විස්තර එමගින් දැනගත නොහැකිය.

2.4 සියබස් ලකරේ එන "කලාගුරු සුලුපා–වැසි වූ කුලුණු නුවණ යුත්, කලණමිතෙ වියතුන් – ගත්හි පියුම් ලකුණු ඇ" යනාදි පද්‍යයන්ගෙන්[51] හද්‍රස්වාමීන්ගේ එළුසඳැස් ලකුණට වඩා පැරණි, සංස්කෘත ඡන්දශ්ශාස්ත්‍රයට නොගැති වූ, සිංහල ඡන්දෝග්‍රන්ථයක් ද එවකට වූ බව පෙනෙයි. මෙහිදී කාව්‍යාදර්ශ මාර්ගයෙන් පිට පැන කරන "පෙදෙන් බුදුසිරිතැ" යන ඉගැන්වීම[52] ද ඒ වනවිට දේශීය කාව්‍යශාස්ත්‍ර සම්ප්‍රදායක් පැවතිබව පෙන්නුම් කරන්නකි. "කිවිබව් කිවිදුමේ – කුසුම්සැපතෙහි විපුල්පෙලෙ, බෝසත්සර වැනුම්-වියතෙමුව පත්වේවා" යන කව්සිළුමිණ පද්‍යයෙන්ද[53] එය තවත් ස්ඵුට වෙයි.

2.5 සංස්කෘත භාෂාවේ ශබ්දයෝගාත්මක විශේෂ ලක්ෂණ මත රඳා ඇති ඇතැම් කාව්‍ය ලක්ෂණ සම්බන්ධයෙන් සියබස්ලකර කතුවරයා කර ඇති වෙනස් කිරීම් ද ඔහුගේ විචාරක්ෂමතාවට මෙන්ම ස්වාධීන සිංහල කාව්‍ය සම්ප්‍රදායක විද්‍යමානත්වයට ද සාක්ෂ්‍ය වශයෙන් ගත හැකිය. සියබස්ලකරේ 32,62 පද්‍යමෙනි. සියබස්ලකරේ "නොතැන්හි වැනුමෙවත්" යනාදි පද්‍යය[54] එහි කතුවරයා දණ්ඩීන්ට ද වඩා ඖචිත්‍යය ගැන සැලකිලිමත් වූ බවක් පෙන්වයි.

2.61 ලක්දිව කාව්‍ය ශාස්ත්‍ර සම්ප්‍රදාය ගැන විමසීමේදී සියබස්ලකර සපයන සාක්ෂ්‍ය අතුරින් වැදගත්ම සාක්ෂ්‍යය වශයෙන් සැලකිය හැක්කේ,

"පෙනෙතත් අත්බෙලෙන් – එන අරුත ද සදතු දෙක
යම් සද සවනතෙහි හෙත – හැහෙනු පෙනෙතත් නම් වේ,
වෙන වෙන දුටු සදින් – බඳනෙව් පහනින් පෙනෙන
දැනෙන අනුමෙනෙනරුතට – අත්බෙලෙනෙනරුත් වියත්,
තුමුල් සිරුරැති මේ – දහවල් බත නොබුදි යත,
දහවල් නොකනු පෙනෙනත – රෑ බත් බෙලෙනෙන අරුත්"[55]

යනුවෙන් ග්‍රන්ථාවසානයට පෙර අර්ථාපත්තිවිභාගය පිළිබඳව කරන සඳහනයි. මෙහි 'පෙනෙතත්' නම් වචන බලයෙන් කෙළින්ම පැවසෙන හෙවත් ශබ්දයේ අභිධා ශක්ති බලයෙන් ලැබෙන අර්ථයයි; එනම් ධවන්‍යාලෝකාදියෙහි විස්තර වන වාච්‍යාර්ථයයි. "අත්බෙලෙන් එන අරුත්" නම් ධවන්‍යාලෝකාදියෙහි විස්තර වන 'ප්‍රතීයමාන' අර්ථයයි. ධවනිවාදීන්ගේ සියුම් විවරණයන්ට පමණක් නොව රස–ඖචිත්‍ය-වක්‍රොක්ති වාදීන් ඇතුළු විවිධ සාම්ප්‍රදායික අලංකාරිකයන්ගේත් අර්ථවිචාර වාදීන්ගේ හා දර්ශනිකයන්ගේත් තර්ක–විතර්ක–විවරණයන්ට මුල්වූ ඉගැන්වීමකි උක්ත පද්‍යත්‍රයෙහි සම්පිණ්ඩිතව ඇත්තේ. එසේ හෙයින් මෙය සියබස්ලකර කාලය වනවිට යථෝක්ත කාව්‍ය ශාස්ත්‍ර සම්ප්‍රදායන්හි මූලික ඉගැන්වීමක් වූ කාව්‍යයේ වාච්‍යාර්ථ ව්‍යංග්‍යාර්ථ විභාගය පිළිබඳ අදහස් ලක්දිව කවියන් හා උගතුන් විසින් සම්මානිත වූ බව පෙන්වන ප්‍රබල සාධකයකි.

2.62 සියබස් ලකරෙහි ආ 'පෙනෙන අරුත්' 'අත්බෙලෙන් එන අරුත්' විභාගය, සංස්කෘත කාව්‍ය ශාස්ත්‍රීය ඉගැන්වීම් අතුරෙන් ධ්වන්‍යාලෝකයේ එන වාච්‍යාර්ථ ප්‍රතීයමානාර්ථ විභාගයට බෙහෙවින් සමාන බව ඉහත දක්වා ඇත. මේ සම්බන්ධයෙන් සියබස් ලකරෙහි ආ පහන් උපමාව ද

''ආලෝකාර්ථී යථාදීපශිඛායාං යත්නවාඤ්ජනඃ
තදුපායතයා තද්ධර්ථෙ වාච්‍යෙ තදදෘතඃ''[56]

යන්නෙන් ධ්වන්‍යාලෝකයෙහි කී දීපශිඛා උපමාවට අරුත් විසින් සමාන වෙයි. ධ්වන්‍යාලෝකකාර ආනන්දවර්ධන 9 වන සියවසේ දෙවන භාගයේ (860–890) විසුවෙකි. සිංහල සාහිත්‍ය විචාරකයන් – ඉතිහාසඥයන් බොහෝ දෙනා දක්වා ඇති පරිදි සියබස් ලකර කළ සලමෙවන් රජු සේන I (833-853) යයි ගනිතොත්[57] එහි අර්ථාපත්ති විභාගය ආනන්දවර්ධනගෙන් ගත් සේ සිතීමට ඉඩක් නැත. තවත් විචාරකයන් කියන පරිදි ඔහු III සේන (938–946)[58] හෝ VI සේන (954–956)[59] වශයෙන් ගන්නාවිට මෙම කාලපරිච්ඡේදය පිළිබඳ ප්‍රශ්නය පැන නොනගී. එහෙත් මෙහිදී තවත් සැලකිය යුත්තක් ඇත. ධ්වන්‍යාලෝකය ප්‍රධාන අංග දෙකකින් යුත් කෘතියකි. එහි එන කාරිකා 129 මූලිකාංගය වන අතර, එම කාරිකා විවරණ කරමින් ලියා ඇති සෝදාහරණ වාර්තිකය දෙවන අංගය වෙයි. ධ්වනිවාදය ප්‍රබල කාව්‍යවිචාර වාදයක් වශයෙන් නගා තබන වාර්තිකය නම් ආනන්දවර්ධනගේ බවට විවාදයක් නැත. කාරිකාවද ඔහුගේ ම කෘතියක් බව බොහෝ දෙනාගේ විශ්වාසය වුවද ඇතැම් විචාරකයෝ එසේ නොපිළිගනිති. ධ්වන්‍යාලෝක ලෝචනය ලියූ අභිනව ගුප්තගේ (980–1020) පිළිගැනීම එය සහෘදයාගේ (800–825) බවයි. මුකුලභට්ට ද (900–925) මේ මතය දැරුවෙක් විය.[60] කෙසේ වුවද මෙම අර්ථාපත්ති විභාගයේදී ධ්වන්‍යාලෝකයෙහි හෝ එහි කාරිකාවෙහි හෝ නොවේනම් ''කාව්‍යස්‍යාත්මා ධ්වනිරිති බුධෛර්‍යඃ සමාම්නාත පූර්වඃ''[61] යනුවෙන් කාරිකාරම්භයෙහි සඳහන් කළ පූර්වතර ධ්වනිවාදී ඇදුරන්ගේ කෘතියක හෝ ආභාසය සියබස්ලකරට ලැබෙන්නට ඇතැයි සිතීම යුක්ති සහගතය.

2.63 ජෛමිනි, නාගර්ජුන, දිඞ්නාග, භර්තෘහරි, ධර්මකීර්ති ආදීන්ගේ න්‍යායික හා අර්ථවිචාරාත්මක ඉගැන්වීම්වල බලපෑම ශාබ්දික– ආලංකාරික – දර්ශනිකයකුවූ භාමහගේ පටන්ම සකු ආලංකාරිකයන් බොහෝ දෙනා කෙරෙහි දක්ක හැක්කකි. භාමහගේ කාව්‍යාලංකාරයේ චතුර්ථ පරිච්ඡේදය මෙයට නිදසුන් වේ. ප්‍රතීයමානාර්ථය හැඳින්වීම සඳහා සියබස්ලකරෙහි යෙදුණු 'අනුමෙනෙන්'[62] යන්නෙන් පැවසෙන 'අනුමානය' බෞද්ධ අබෞද්ධ දෙපක්ෂයේ ම න්‍යායිකයන් විසින් පාරිභාෂිකයක් වශයෙන් බෙහෙවින් භාවිත කරන ලද්දකි. ද්විවිධ අර්ථය පැහැදිලි කිරීම සඳහා සියබස්ලකර දුන් නිදසුන වූ ''තුමුල් සිරුරැති මේ දහවල් බත නොබුදි''[63] යන්න පවා, ශබරස්වාමීන්ගේ (3 සියවස) මීමාංසා සූත්‍ර භාෂ්‍යයෙන් දක්වෙන පරිදි පංචවිධ ලක්ෂණාප්‍රකරණයෙහි ලා මීමාංසක භට්ටමිශ්‍ර විසිනුත්, ඉන්පසු මෙම අර්ථාපත්ති විවාදයට සහභාගි වූ විවිධ සම්ප්‍රදායන්ට අයත් බොහෝ දර්ශනිකයන් විසිනුත් ගෙනහැර පා ඇති ''පීනෝ දේවදත්තඃ දිවා න භුංක්තෙ'' යන නිදසුන් වැකියෙහි පරිවර්තනයකි. ඉහත කී මුකුලභට්ටයන්ගේ අභිධාවෘත්තිමාතෘකාවද එය ගෙනහැර දක්වයි.[64]

2.7 සියබස් ලකර ආරම්භයෙහි එන ''දෙරැස්වස් කියම්–පෙරගත් සැකෙව්නි දූ වූ නොදත නොදත දෙව්බස්–සියකව් ලකුණිනෙක් දෙස්''[65] යන්නෙන්ද කව් ලකුණු සැකෙවින් දක්වූ සිංහල පොතක් එකල වූ බව ඉඳුරා කියවෙන අතර, එකල විසූ ඇඳුරුන් සකුකව්ලකුණුගත් පරිශීලනය කළබව වක් මගින් කියවෙයි.

**2.8** දුහුන කිවියනට **"පෙරකිවිසමා** නොම ලැබෑ"[66] පැදි බඳනා ලෙස අනුසස්නා සිදතේ ඉටුනිවුලකර අදියර දෙකින් ද විෂයසීමාවේ පෘථුලත්වය කෙසේ වුවත්, සිංහල කාව්‍යශාස්ත්‍රය එළුසඳස් ලකුණට හා සියබස්ලකරට සීමා නුවූ බව එක් අතකිනුත්, වාමන, රාජශේඛරාදීන් ගෙන හැර පෑ කවිසමයට ගරු කළ බව අනිත් අතිනුත් ගම්‍ය වෙයි.

**3.0** පොළොන්නරු යුගයේ අවසාන භාගය (හා දඹදෙණි යුගය?) තුළ ධර්මශාස්ත්‍රීය සේවාවන්හි යෙදුණු සංඝරක්ෂිත හිමියන්ගේ සුබෝධාලංකාර නම් පාලිකාව්‍යානුශාසනය ද ලක්දිව සාහිත්‍යශාස්ත්‍ර සම්ප්‍රදාය ගැන විමසීමේ දී බෙහෙවින් වැදගත් වෙයි. කරුණු අතින් මෙන්ම සැලැස්ම අතින් ද සියබස් ලකර හැකිතාක් දුරට කාව්‍යාදර්ශය අනුගමනය කළ බව අපි දනිමු. සුබෝධාලංකාරය කාව්‍යස්වරූපය, කාව්‍යගුණ හා කාව්‍යාලංකාර හඳුන්වා දීමේදී ඇතැම් නිදසුන්ද ඇතුළුව කරුණු අතින් කාව්‍යාදර්ශය හා සාමාන්‍යයෙන් එකඟ වන නමුත් එහි සැලැස්ම සකස් කොට කාව්‍යගුණ සඳහා සම්පූර්ණ පරිච්ඡේදයක් වෙන් කොට ඇත. කාව්‍යදෝෂ විවරණයේදී දණ්ඩින්ට හෝ භාමහට හෝ වඩා වාමන අනුගමනය කරන බව පෙනේ. පදදෝෂ, වාක්‍යදෝෂ, වාක්‍යාර්ථදෝෂ වශයෙන් කර ඇති දෝෂවර්ගීකරණය ද වාමනගේ බලපෑම පෙන්නුම් කරයි. දෝෂ පරිහාරයෙහි ලා ඖචිත්‍යයට විශේෂ තැනක් දී ඇත්තේ ක්ෂේමේන්ද්‍රගේ ආභාසයෙන් විය හැකිය. සුබෝධාලංකාරයේ වඩාත්ම වැදගත් කොටස නම් 'රසභාවාවබෝධ' නම් වූ 5 වන පරිච්ඡේදයයි.

> "පටිභානවතා ලෝක වෝහාරමනුසාරිනා
> තතෝ චිත්‍ය සමුල්ලාස වෙදිනා කවිනා පරං
> ඨායී සම්බන්ධිනො භාවා විභාවා සානුභාවකා
> සමපජ්ජන්ති නිබද්ධා තෙ රසස්සාදය සාධුනං"[67]

යනුවෙන් ඇරඹෙන මෙම විවරණයේ සංක්ෂිප්තභාවයත්, සාරගර්භතාවත්, නිරවුල් බවත් නිසා එය කාව්‍යප්‍රකාශ, සාහිත්‍යදර්පණ රසභාවවිවරණයන්ට ද වඩා සිත් ගන්නා සුලු වෙයි. රසභාවාවබෝධය සඳහා සුබෝධාලංකාරකරු භරත, අභිනවගුප්ත, භට්ටනායක, මම්මට යන මොවුන්ගේ කෘති වෙසෙසිනුත්, රුද්‍රභට්ට, භෝජ, රුය්‍යක ආදීන්ගේ කෘති සාමාන්‍යයෙනුත් ඇසුරු කරන්ට ඇතැයි සිතිය හැකිය. සියබස්ලකරත් කාව්‍යාදර්ශයත් දෙකම 'රසවත්බව' සැලකුවේ අර්ථාලංකාරයන්ගෙන් එකක් සේ වුවද මෙහි ඊට ලැබී ඇත්තේ විශේෂ වැදගත් තැනකි. රස සංඛ්‍යාවද සියබස්ලකරෙහි හා කාව්‍යාදර්ශයෙහි අටක් වන නමුත් මෙහි නවයක් වෙයි.

**4.1** දසවන සියවස නැතහොත් ඊටත් පෙර පටන් සකුකවිසතරේ ආභාසය පාලි ගද්‍ය පද්‍ය කාව්‍ය කෙරෙහි විහිදුණු නමුත් තාලපුට, සබ්බක, සුභා වැනි ථෙර ථෙරී ගාථාවලත් ධනිය සුත්ත වංගීස සංයුක්තාදියෙහිත් පිළිබිඹුව පෙනෙන ජනතා සිතුම්පැතුම් පිළිබඳ සහානුවේදිතාවත් අව්‍යාජත්වයත් රැක ගැනීමට පාලි කාව්‍යග්‍රන්ථ කළ ලක්දිව බොදුකවියන් සමත් වූ බව පාලි මහාබෝධිවංස, දාඨාවංස ආදියෙන් හෙළි වේ. දසවන සියවසේ ලියවුණු පාලි මහාබෝධිවංසයට පොළොන්නරු යුගයේදී ලියා ඇති සිංහල ව්‍යාඛ්‍යාන ග්‍රන්ථයක් වන මහාබෝධිවංශ ගැටපදය ද ලක්දිව කාව්‍ය ශාස්ත්‍ර සම්ප්‍රදාය පිළිබඳ විමර්ශනයක දී වැදගත් වන සාධක කීපයක් සපයයි. 'කවිජනමනකමල විකසන කරෝ' යන පාලිපාඨයට විවරණ සපයන ගැටපදකරු කවියන්ගේ ප්‍රභේද 4 ක් දක්වයි. මෙහිදී ඔහු අනුගමනය කරන්නේ සංස්කෘත කාව්‍යශාස්ත්‍ර ග්‍රන්ථ නොව දේශනාපාලිය

බව ''චත්තාරො මෙ භික්ඛවෙ කවී, කතමෙ චත්තාරො, චින්තාකවී, සුතකවී, අත්ථකවී, පටිභාන කවීති'' යනුවෙන් අංගුත්තරනිකාය චතුක්ක නිපාතයේ එන සූත්‍රයක් උපුටා දක්වීමෙන්[68] පෙනේ. එකල ලක්දිව උගතුන් බොහෝ දෙනා සංස්කෘත කාව්‍ය ශාස්ත්‍ර ග්‍රන්ථ පරිශීලනය කළද අවිචාරයෙන් ඒවා අනුගමනය නොකළ බවට මේ සාක්ෂ්‍ය වෙයි.

4.11 බෝධිවංශ ගැටපදකාරයා සකුකවිසතර දත්තකු බව නිසැකය. ඉහත කී අර්ථවිවරණයට අනතුරුව, 'සනිඝණ්ඩු කෙටුභානං', 'සාක්ඛරප්පභෙදනං' යන පාඨයන්ට දුන් අර්ථවිවරණවලින් ඒබව හෙළිවෙයි: ''එහි නිඝණ්ඩු නම් නාම නිඝණ්ඩුයැ. හෙද ත්‍රිකාණ්ඩ උත්පලිනි අමරමාලා සෙයින් වෘක්ෂාදීන්ගේ පර්යායවචන ප්‍රකාශක ශාස්ත්‍රයයි. කේටුභ නම් ක්‍රියාකල්ප විකල්පයැ හේ දූන් ජයදේව දණ්ඩී සෙයින් කවීන්ට උපකාරවූ ඡන්දෝලක්ෂණ ජාති ලක්ෂණ වෘත්තලක්ෂණ වෛදර්භමාර්ග, ගෞඩමාර්ග ප්‍රකාශක ශාස්ත්‍රය යි.''[69] මෙම පාඨයෙහි නිදර්ශිත දණ්ඩී නම් සියබස්ලකරට ගුරු වූ කාව්‍යාදර්ශ කතුවරයා බව අපි දනිමු. එහි ප්‍රකාශිත කරුණු අතර වෛදර්භමාර්ග, ගෞඩමාර්ග ද වෙයි. දණ්ඩීගේම තවත් කෘතියක් වූ ඡන්දෝ-ජාති-වෘත්ත ලක්ෂණ ඇතුළත් 'ඡන්දෝ විචිතිය'ද එකල ලක්දිව ප්‍රසිද්ධව තිබෙන්නට ඇත. එහි එන ජයදේව ද ඡන්දෝලංකාර ග්‍රන්ථකතෘවරයකු විය යුතුය. එබැවින් මෙහි අභිමත වූයේ ගීත ගෝවින්දකාර 'ජයදේව' විය නොහැකියි. චන්ද්‍රාලෝක නම් කාව්‍යශාස්ත්‍රීය ග්‍රන්ථය ලියූ 'ජයදේව' විසුයේ 12 වන සියවසේදීය.[70] ඔහු බෝධිවංශ ගැටපදකරුගේ සමකාලිකයකු වන්නට ඇත. උද්ධෘතපාඨයෙහි ''දූන් ජයදේව'' යන්නෙහි 'දූන්' යන්නෙන් අදහස් කළ විශේෂාර්ථය එය විය හැකිය. එසේනම් කතුවරයා ජීවත්ව සිටියදීම ඔහුගේ කෘතිය ලක්දිව තෙක් ප්‍රචලිත වූවා විය යුතුය. මයූඛ 10 ට බෙදඇති චන්ද්‍රාලෝකයෙහි විෂයමාලාව කාව්‍යාදර්ශයට වඩා බෙහෙවින් පුළුල්ය 1. වාග්විචාර, 2. දෝෂාභිනිරූපණ, 3. ලක්ෂණ නිරූපණ, 4. ගුණ නිරූපණ, 5. අලංකාර නිරූපණ, 6. රස නිරූපණ, 7. ධවනි නිරූපණ, 8. ව්‍යංග්‍යනිරූපණ, 9. ලක්ෂණානිරූපණ, 10. අභිධා නිරූපණ යන මයූඛ නාමයන්ගෙන් පමණක් වුවද පෙනී යායුතු පරිදි භාරතීය කාව්‍යශාස්ත්‍ර ක්ෂේත්‍රයෙහි අන්තර්ගත වන වැදගත් මාතෘකා හැමෙකක්ම පාහේ ඔහු සාකච්ඡා කොට ඇත.[71] චන්ද්‍රාලෝකයෙහි අවසාන පරිච්ඡෙද 3 ම වෙන්ව ඇත්තේ අර්ථවිචාරයටය. රස විවරණයටත් ධවනිවිවරණයටත් පරිච්ඡෙදය බැගින් කැප කෙරේ. ප්‍රමාණයෙන් විශාලවූ අලංකාර පරිච්ඡෙදයෙහි අනුප්‍රාසවිශේෂාදි ශබ්දලංකාරවලින් අනතුරුව අර්ථාලංකාර 100 ක් දර්ශිතය. චන්ද්‍රාලෝකය ලියා වැඩිකලක් යන්නට පෙර ලක්දිව ප්‍රචලිතවීම, එවකට රටේ පැවති කාව්‍ය ශාස්ත්‍ර සම්ප්‍රදයේ ප්‍රවණතාව දක්වන්නක් සේ ගත හැකිය. ජයදේවගේ නම මුලින් දී තිබීම නිසා සමහරු ඔහු ඡන්දෝ ග්‍රන්ථ කතෘවරයකු සේද සලකති. එහෙත් එබඳු ජයදෙවකෘත ඡන්දෝග්‍රන්ථයක් ගැන මෙතෙක් දැනගන්නට ලැබී නැත. වේදාංග 6 න් එකක් සේ සැලකෙන ඡන්දසේ ඉතිහාසය ඈත අතීතය තෙක් දිවෙන්නකි. වෛදික විරිත් හඳුන්වා දෙන 'නිදානසූත්‍ර'ත් ඍක්ප්‍රාතිශාඛ්‍ය ශ්‍රෞතසූත්‍රාදියෙහි එන විරිත් විවරණත් පිඞගල ඡන්දස්සූත්‍රයට ද වඩා පැරණිය. ඉන් මෑත භාගයට අයත් කාලිදාසගේ (6 සියවස) වෘත්තරත්නාවලී හා ශ්‍රැතබෝධ, ජනාශ්‍රයගේ (ක්‍රි.800 පමණ) ඡන්දෝවිචිති, ක්ෂේමේන්ද්‍රගේ (11 සියවස) සුවෘත්තතිලක, හේමචන්ද්‍රගේ (12 සියවස) ඡන්දෝනුශාසනා, කේදාරභට්ටගේ (14 සියවස) වෘත්තරත්නාකර, ගංගාදාසගේ (15 සියවස) ඡන්දෝමංජරී ආදියෙහි හෝ එබඳු ඡන්දෝග්‍රන්ථයක් ගැන සඳහන් නොවේ.

4.12 යථෝක්ත ගැටපදයෙහි 'කේටුභ' යන්නට පර්‍යාය වචනයක් සේ 'ක්‍රියාකල්ප විකල්පය' දී තිබීම ද වැදගත්ය. කේටුභ යන්නෙන් මෙන්ම ක්‍රියා කල්පවිකල්ප

යන්නෙන් ද ඡන්දස් අලංකාර දෙකම අභිප්‍රේතයයි ගැටපද කතෘ සැලැකූ බව එහි ලා දී ඇති අර්ථවිවරණයෙන් පෙනේ. සාහිත්‍යවිද්‍යා කාව්‍යානුශාසනා, කාව්‍යශාස්ත්‍ර, අලංකාර ශාස්ත්‍ර යන නම් ව්‍යවහාරයට ඊමට පෙරාතුව කාව්‍යකරණ උපදේශ හැඳින්වුණේ 'ක්‍රියා විධි' 'ක්‍රියාකල්ප' යන නම් වලින් බව රාඝවන් ආදී පඬිවරුන්ගේ අදහසයි. ක්‍රියාවිධි යන්න දණ්ඩින්ගේ කාව්‍යාදර්ශයෙහි ද එන්නකි. වාත්ස්‍යායන කාමසූත්‍රයේ (ක්‍රි.3 සියවස) චතුඃෂෂ්ටි කලා නාමාවලියේ කාව්‍යක්‍රියා අභිධාන කෝශ හා ඡන්දෝඥාන ළඟට ක්‍රියා විකල්ප දැක්වීමෙන් පෙනෙන්නේ එයද කාව්‍යකරණය හා සම්බන්ධ ශාස්ත්‍රයක් බවත්, යශෝධර (ක්‍රි. 1000 පමණ) කාමසූත්‍රයට ලියූ 'ජයමඞ්ගලා' ව්‍යාඛ්‍යාවෙහි ''ක්‍රියාවිකල්ප ඉති කාව්‍යකරණවිධිඃ කාව්‍යාලංකාර ඉත්‍යර්ථඃ, ත්‍රිතයම්පි'' යන අර්ථකථනයෙන් ඒ මතය තහවුරු වන බවත් රාඝවන් පෙන්වා දෙයි.

ජයමඞ්ගලා අර්ථකථනය අනුව ක්‍රියා විකල්ප යන්නෙන් සමහරුන් කාව්‍යාලංකාර පමණක් ද, තවත් අය නිඝණ්ඩු ඡන්දස් අලංකාර යන කාව්‍ය කරණෝපකාරී විෂයත්‍රයම ද ගත් බව ප්‍රකට වෙයි. කාව්‍යමීමාංසායෙහි නාමධාතු පාරායණ, අභිධාන කෝශ, ඡන්දෝ විචිති, අලංකාර යන චතුෂ්කය කාව්‍යවිද්‍යා වශයෙන් දක්වා ඇත.[73] බෝධිවංශ ගැටපදයේ ක්‍රියාකල්ප විකල්පය ම කාමසූත්‍රාදියෙහි ක්‍රියාවිකල්ප නමින් හැඳින්වී ඇති බව ප්‍රකරණ සම්බන්ධය අනුව නිශ්චය කළහැකිය. එබැවින් ක්‍රියාවිකල්ප පර්‍යාය වූ 'කේටුභ' ශබ්දය ද ජයමඞ්ගලාවෙහි ආ ද්විවිධ අර්ථකථනයට යටත්වීම අපේක්ෂා කළ යුත්තකි. බෞද්ධ සාහිත්‍යයෙහි ඡන්දෝලංකාරද්වය සඳහා එය ව්‍යවහාර වූ බවට සාක්ෂ්‍ය ඇත. ක්‍රියා විකල්ප මෙන් නොව 'කේටුභ' යන්න වැඩිපුරම බෞද්ධයන් භාවිත කළ වදනකි. දිව්‍යාවදනයෙහි එන කෛටභ යන්න පාලි 'කේටුභ' ශබ්දයේ සංස්කෘත රූපය සේ ගත හැක. දේශනාපාලියෙහි හා අටුවා වලද පැරණි දඹදිව බ්‍රාහ්මණ සාම්ප්‍රදායික පාණ්ඩිත්‍යය විස්තර කරන තන්හි බොහෝ විට මෙය යෙදී ඇත. දීඝනිකායේ අම්බට්ඨ සූත්‍රයෙහි ලා අම්බට්ඨගේ පාණ්ඩිත්‍යය ගැන කියන ''තිණ්ණං වෙදනං පාරගූ සනිඝණ්ඩු කෙටු-භානං සාක්ඛරප්පභෙදනං ඉතිහාසපංචමානං''[74] යන පාඨයෙහි මෙනි. මෙහි අභිධාන හෙවත් නිඝණ්ඩු වෙනමත් කේටුභ වෙනමත් එන නිසා කේටුභ යන්නෙන් ඡන්දෝ-ලංකාර දෙක පමණක් ගනු මිස අභිධාන ද එහි ඇතුළත් කරනු නොයෙදෙයි. එබැවින් බෝධිවංශ ගැටපදයේ අර්ථවිවරණය දේශනාපාලිය සමග ගැළපෙයි. එම ගැටපද අර්ථවිවරණයට මාතෘකා වූ පාලිපාඨය මහාබෝධිවංශයෙහි එන්නේ මොග්ගලී බමුණු සිග්ගව තෙරුන්ගෙන් ප්‍රශ්න ඇසීම ගැන කියන තැනදීය. එය සකස්ව ඇත්තේ දීඝ-නිකායාදියෙහි එන යටකී දේශනා පාලිපාඨය ඇසුරින් බව පැහැදිලිය.

4.121 මෙහිදී බෝධිවංශ ගැටපදයේ එන විස්තරාර්ථවර්ණනාව යථෝක්ත පාලිපාඨයට අට්ඨකථාචාරීන් දෙන අර්ථවිවරණ හා සසඳා බැලීම ප්‍රයෝජනවත්ය. යටකී දීඝනිකාය පාඨයෙහි ආ 'කේටුභ' යන්නට සුමංගල විලාසිනීය දෙන අර්ථවිවරණය නම් ''කෙටු-භන්ති ක්‍රියාකප්ප විකප්පො, කවීනමුපකාරාය සත්ථං''[75] යනුයි. බෝධිවංශ ගැටපදය හා සමීප කාලික වූ 'අභිධානප්පදීපිකා' නම් පාලි නිඝණ්ඩුව ද ''කෙටුභන්තික්‍රියාකප්ප-විකප්පො කවීනං හිතො''[76] යනුවෙන් අටුවාව දුන් අරුතම ප්‍රතිරාවය කරයි. බෝධි වංශ ගැටපද කරුද අටුවාව දුන් අර්ථය ඒ අයුරින් ම පිළිගන්නා අතර, එහි කී කවීන්ට උපකාරී වූ ශාස්ත්‍රය නම් කුමක්දැයි හඳුන්වා දී නිදසුන් සපයමින් එය තවදුරටත් පැහැදිලි කර ඇත.

4.122 12 වන සියවසේ ලක්දිව විසූ ටීකාකාර ශාරිපුත්‍ර හිමියන්ගේ සාරත්ථ දීපනීය[77] 'ක්‍රියාකප්පවිකප්ප' යන්නට නිරුක්ත්‍යර්ථ දක්වා, ''සොපන වණ්ණ පදබන්ධ පදත්ථාදි-විභාගතො බහුවිකප්පොති ක්‍රියාකප්පවිකප්පොති වුච්චති. ඉදංච මූලක්‍රියාකප්පගන්ථං

සන්ධාය වුත්තං'' යනුවෙන් අභිධෙයාර්ථ හා තාත්පර්‍යාර්ථද දක්වයි. චෝළියකස්සප හිමියන්ගේ විමතිවිනෝදනිය[78] ඒ මගම ගොස් ඇත. අටුවාවෙහි නැති විස්තර බෝධිවංශ ගැටපදයෙහි ඇතත් එය ටීකාර්ථවිවරණයට සාකල්‍යයෙන් එකඟ නොවේ. ටීකාර්ථ විවරණයට අනුව ක්‍රියා කල්ප විකල්පයට කාව්‍යාලංකාර ඇතුළත් වන්නේ කෙසේද යනු ඉඳුරා පළ නොවේ. ටීකාවෙහි වණ්ණබන්ධය ඡන්දස සමගත්, පදබන්ධ පදවිභාගයන් කාව්‍යාලංකාර හා ව්‍යාකරණ සමගත් ගැළපීමෙන් පමණක් කාව්‍යාලංකාරවිධි එයට ඇතුළත් කළ හැකිවෙයි. එහෙත් ක්‍රියාකල්ප විකල්ප යන්නෙන් ටීකාචාරීන් බ්‍රාහ්මණ පාණ්ඩිත්‍යයෙහිලා අවශ්‍ය අංගයක් වූ 'කල්පසූත්‍ර' යන අරුත දීමට අපේක්ෂා කළ බවක් ''ඉදංච මූලක්‍රියාකප්ප ගන්ථං සන්ධාය වුත්තං'' යන්නෙන් හැඟේ.

4.123 කෙසේ වුවද සාහිත්‍ය විල්ගම්මුල හිමියන්ගේ (14 සියවස) සිංහල බෝධිවංශය යටකී පාලිබෝධිවංශ පාඨය සිංහලයට නගා ඇත්තේ ''ක්‍රියාකල්ප විකල්ප'' යන්නෙන් 'ඡන්දෝලක්ෂණ' පමණක් අභිමතයයි සලකා ගෙන බව ''වෘක්ෂාදීන්ගේ නාම ප්‍රකාශකරන්නාවූ නිඝණ්ඩු හා ක්‍රියාකල්ප විකල්ප නම් වූ කවිජනයන්ට උපකාර වූ ඡන්දො ලක්ෂණයෙහි ද ශික්ෂා නිරුක්ති ප්‍රභෙදයෙහි ද''[79] යන පාඨයෙන් හෙළිවේ.

4.124 ටීකාචාරීන් දැක්වූ අර්ථය දේශනා පාලාගත මූලපාඨය සමග ගැළපිය හැකි වුවද, සූසැටකලා නාමාවලියට නම් මෙහිදී වඩා උචිත වන්නේ ඡන්දෝලංකාර අර්ථය නැතහොත් කාව්‍යාලංකාර අර්ථය බව එකී නාමයන් දී ඇති අනුපිළිවෙළ දෙස බැලීමේදී පෙනීයයි. සිදුහත් කුමරුන්ගේ අධ්‍යාපනය ගැන කියන ලලිතවිස්තර පාඨයෙහි[80] සූසැටකලා නාමාවලියක් එන අතර එය සාමාන්‍යයෙන් වාත්ස්‍යායන කාමසූත්‍ර නාමාවලියට[81] එකඟ වෙයි. මයූරපාද පරිවෙණාධිපති බුද්ධපුත්‍රයන්ගේ (13 සියවස) පූජාවලිය සිදුහත් කුමරුන් සියනෑයන් ඉදිරියේ ශිල්ප දැක්වීම විස්තර කරන තැන්හි (10 පරිච්ඡේදය) අෂ්ටාදශශිල්ප හා සූසැටකලා නාමාවලියක්[82] දී ඇති අතර, එයද සාමාන්‍යයෙන් ලලිතවිස්තර නාමාවලියට අනුකූල වෙයි. එහෙත් එහි ක්‍රියාවිකල්පය වෙනුවට පූජාවලියෙහි ඇත්තේ අලංකාරයයි. පාලි රසවාහිනියේ (12 සියවස) විස්තරාත්මක පරිවර්තනයක් සේ සැලකෙන සද්ධර්මාලංකාරය (14 සියවස) දහම්සොඬ වස්තුවෙහි ලා ''සබ්බසිප්පෙසු නිප්ඵත්තිං පත්වා'' යන රසවාහිනී පාලිපාඨයාගේ ස්ථානයෙහි ගෙනහැර දක්වා ඇති අෂ්ටාදශශිල්ප හා සූසැටකලා නාමාවලිය ද[83] ක්‍රියාකල්ප වෙනුවට 'අලංකාරය' යනුම දෙයි. ''තවද තමන්ම විශේෂයෙන් ශිල්පී පරිදි හඟවන්නාහු......තර්කය, ව්‍යාකරණය, ඡන්දස්ය, නිඝණ්ඩුය, අලංකාරය...'' යනාදී පූජාවලී නාමාවලියෙහිත්, එයට පූර්වයායී වූ ලලිතවිස්තර, වාත්ස්‍යායන නාමාවලින්හිත්[84] කාව්‍යබන්ධනයට අවශ්‍ය පරිෂ්කාර වන කලාවන් එක්තැන් කොට දක්වා තිබීම වෙසෙසින් වැදගත්ය.

4.125 ක්‍රියාකල්ප යනු අලංකාර ශාස්ත්‍රය සඳහා මුල්භාගයේ ව්‍යවහාරවූ නාමාන්තරයක්ය යන ඉහත කී රාඝවන්ගේ මතය කානේ විසින් ප්‍රතික්ෂේප කර ඇත. එහෙත් අප මෙතෙක් කී දැයින් පෙනී යන්නේ කේටුභ යන්න මෙන්ම 'ක්‍රියා විකල්ප' යන්නත් ඡන්දෝලංකාර, නැතහොත් අලංකාර ශාස්ත්‍රය හඳුන්වන පර්යාය නාමයක් වශයෙන් පිළිගැනීමක්, යටත් පිරිසෙයින් ලක්දිව පඬිවරුන් අතර හෝ තිබුණු බවයි. එහෙත්, 'ක්‍රියාවිකල්ප' යනු වැරදි ව්‍යවහාරයක් බවටත් 'ක්‍රියාකල්ප' යනුම නිවැරදි පාඨය බවටත් රාඝවන් දරන මතය ප්‍රතිෂ්ඨා විරහිත බව බෝධිවංශ ගැටපදයෙන් මෙන්ම සාරත්ථදීපනී ආදියෙහි ආ 'ක්‍රියාකප්පවිකප්ප' විග්‍රහයෙන් ද ස්ඵුට වේ.

4.21 බෝධිවංශ ගැටපදයෙන් එළිවන තවත් කරුණක් නම් එහි කර්තෘ 'ස්ඵෝටවාදය' නමින් හැඳින්වෙන භාරතීය අර්ථවිචාරවාද විශේෂය ක්‍රමවත් සේ ඉදිරිපත් කළ භර්තෘහරිගේ වාක්‍යපදීය දැන සිටි බවයි. ඔහු ''අථායං'' යන්නෙහි අර්ථවිවරණය කරමින් අර්ථප්‍රතීතියෙහි ලා කේවල ශබ්දයම නොව ප්‍රයෝජන, ප්‍රකරණ ආදිය ද වහල් වන බවට,

''අර්ථාත් ප්‍රකරණාල්ලිංගාදෞචිත්‍යාද්දෙශකාලතඃ
ශබ්දර්ථාඃ ප්‍රවිභජ්‍යන්තෙ න ශබ්දදෙව කෙවලාත්''

යන පද්‍යය නිදසුන් විසින් උපුටා දක්වයි.[85] මෙය ශෞනකගේ බෘහද්දේවතාවෙහි

''අර්ථාත් ප්‍රකරණාල්ලිංගාදෞචිත්‍යාද්දෙශකාලතඃ
මන්ත්‍රෙෂ්වර්ථ විවෙකඃ ස්‍යාදිතරෙෂ්විතිච ස්ථිතිඃ''[86]

යන පද්‍යයේ පූර්වාර්ධයත්, වාක්‍යපදීයෙහි එන.

''වාක්‍යාත් ප්‍රකරණාදර්ථාදෞචිත්‍යාද්දෙශකාලතඃ
ශබ්දාර්ථාඃ ප්‍රවිභජ්‍යන්තෙ න ශබ්දදෙව කෙවලාත්''[87]

යන පද්‍යයේ අපරාර්ධයත් එකට ගැළපීමෙන් සැකසුණක් සේ පෙනේ. වාක්‍යපදීයෝක්තියේ 'වාක්‍යාත්' යන්න වෙනුවට බෝධිවංශ ගැටපදයේ 'අර්ථාත්' යන්න යෙදීම පමණි එහි වෙනසකට ඇත්තේ. එම සැකසුමට මග පෑවේ බෘහද්දේවතා පාඨය විය හැකියි. අභිධර්මාර්ථ සංග්‍රහ සන්නකාර ශාරීපුත්‍ර හිමියන් ද මෙය උපුටා ගෙන ඇත්තේ[88] බෝධිවංශ ගැටපදකාරයා ගත් තැනින් ම බව පදයෙදුම් අනුව පැහැදිලි වේ.

මේ හැර අර්ථප්‍රතීතිය පිළිබඳවූ වාක්‍යපදීයාගත අදහස් බෝධිවංශ ගැටපද යුගයේ ආචාර්යවරුන් ලියූ මොග්ගල්ලාන පංචිකා රූපසිද්ධි පයෝග සිද්ධි පදසාධන සම්බන්ධ චින්තා වැනි පාලි ව්‍යාකරණයන්හිත් ධර්මප්‍රදීපිකා විශුද්ධිමාර්ග සන්න වැනි අර්ථ ව්‍යාඛ්‍යානයන්හිත් දක්නට ලැබේ.

4.22 13 වන සියවසේ ලක්දිව විසූ වනරතන මෙධංකර තෙරුන් විසින් රචිත පයෝග සිද්ධියෙහිත්[89] ඉන්පසු රහල් හිමියන්ගේ පංචිකාප්‍රදීපයෙහිත්[90] එන

''සංයොගා විප්පයොගාච-සාහචරියා විරොධතො
අත්ථා පකරණා ලිංගා–සද්දන්තර සමීපතො

සාමර්ථ්‍යෝචිත්‍ය දේසෙහි – කාලව්‍යත්තානුරූපතෝ
උපචාරා කාකුභෙද – සම්බන්ධෙහුපලක්ඛණා,
වචනාච තදංගත්තා – පධානත්තාදි ආදිහි
සද්දත්ථා පවිභජ්ජන්තේ – න සද්දමේව කේවලා''

යන ගාථාත්‍රය න්‍යාය සූත්‍රයේ හා වාක්‍යාපදීයේත් කාව්‍ය ප්‍රකාශාදියේත් එන අර්ථාපත්ති ක්‍රමයන්ගේ සංඝටනාවක් සේ පෙනේ:

''සංයෝගඃ* විප්‍රයෝගශ්ච – සාහචර්යං විරෝධිතා (*සංසර්ගඃ : ඇතැම්)
අර්ථඃ ප්‍රකරණං ලිංගං – ශබ්දස්‍යාන්‍යස්‍ය සන්නිධිඃ
සාමර්ථ්‍යමෞචිතී දේශඃ – කාලෝ ව්‍යක්තිඃ ස්වරාදයඃ
ශබ්දර්ථස්‍යානවච්ඡෙදේ – විශේෂස්මෘති හේතවඃ'' (වාක්‍යපදීය)[91]

''වක්තෘ බෝද්ධව්‍ය කාකූනාං – වාක්‍ය වාච්‍යාන්‍ය සන්නිධෙඃ
ප්‍රස්තාවදේශකාලාදෙර් – වෛශිෂ්ට්‍යාත් ප්‍රතිභාජුෂාම්
යෝර්ථස්‍යාන්‍යස්‍ය ධීහේතුර් –ව්‍යාපාරො ව්‍යක්තිරෙව සා'' (කාව්‍යප්‍රකාශ)[92]

4.23 මොග්ගල්ලාන වුත්ති, පයෝගසිද්ධි ඇතුළු පාලි ව්‍යාකරණ ග්‍රන්ථ කීපයකත් පංචිකා ප්‍රදීපාදි අර්ථවිවරණයන්හිත් දක්නට ලැබෙන පංචවිධ නිරුක්ති හා බාහුලක විධි විවරණය ද සංස්කෘත වෛයාකරණොක්තීන්ගේ පාලිපරිවර්තන යි. ධර්මප්‍රදීපිකාදියෙහි සංස්කෘත මූලපාඨයම[93] දී ඇත. බෝධිවංශ ගැටපදයෙහි සංස්කෘත මූලපාඨ විසින් ම දී ඇති ''ධාත්වර්ථං බාධතෙ කශ්චිත්''යනාදී උපසර්ග ගති විග්‍රහය ද[94] මෙසේ ම අනූදිතව පාලිවියරණයන්හි දක්නට ලැබෙන තවත් නිදසුනකි.

4.24 පංචිකාප්‍රදීපකාර රහල් හිමියන් වාක්‍යපදීය මහාභාෂ්‍යය හා ධර්මකීර්ති කෘතිද ඉතා ළඟින් ඇසුරු කළ බව ස්වමත ස්ථාපනය සඳහා නැවත නැවත ඉන් කරුණු ඉදිරිපත් කිරීමෙන් පෙනේ. පොළොන්නරු යුගයේ පටන්ම ලක්දිව අර්ථව්‍යාඛ්‍යානකාරයන් හා වෛයාකරණිකයන් අතර වාක්‍යපදීය හා ධර්මකීර්ති කෘතිද බහුල ප්‍රචලිත වීමෙන් අනුමේය වන එක් කරුණක් නම් එකල පඬිවරුන් අර්ථවිචාර විධි ගැන දැක්වූ විශේෂ සැලකිල්ලයි. සිංහල ව්‍යාඛ්‍යාන කරුවන් එකම කරුණ ගැන විවිධමත ඉදිරිපත් කරන අවස්ථා ද දුර්ලභ නොවේ. ධර්මප්‍රදීපිකාවේත් පංචිකාප්‍රදීපයේත් එන උපචාරාර්ථ විවරණයන් මෙනි. මෙයින් ධර්මප්‍රදීපිකාව ''පාදපංකජෝ'' යන්නට ලියූ පරිකථාවෙහි ලා ගෙන හැර දක්වන උපචාරාර්ථ විවරණය යෝගසූත්‍රකාර පතංජලිගේ මහාභාෂ්‍යයෙන් ගත්තකි: ''චතුර්භිඃ ප්‍රකාරෛඃ අතස්මිං ස ඉත්‍යෙතද් භවති. තාත්ස්ථ්‍යාත්, තාද්ධර්ම්‍යාත් තත්සාමීප්‍යාත්, තත්සාහචර්යාත්''[95] යනු මහාභාෂ්‍ය පාඨයි. ''මෙහි උපචාර නම් අතථාභූත වස්තුහු කෙරෙහි තථාභූතඥාන විශේෂයයි; හෙ චතුර්විධවෙ, තාත්ස්ථ්‍යයැ තාද්ධර්ම්‍යයැ තත්සාහචය්‍ර්‍යයැ තත්සාමීප්‍යයැයි''[96] යනු ධර්ම ප්‍රදීපිකා පාඨයි. එහි ඊළඟට එන උපචාරාර්ථබෝධය සිදුවන ආකාරය පිළිබඳ සනිදර්ශන විවරණය ද මහාභාෂ්‍යය අනුව යේ. ගෞතමගේ න්‍යාය සූත්‍රය උපචාරය දශවිධ කොට දක්වයි: ''සහචරණ ස්ථාන තාදර්ථ්‍ය වෘත්ත මාන ධාරණ සාමීප්‍ය යෝග සාධනා ආධිපත්‍යෙභ්‍යඃ'[97] යනු න්‍යාය සූත්‍රයි. වාක්‍යපදීයෙහි සංයෝග විප්‍රයෝගාදි විශේෂාර්ථජනක කරුණු 14 ක් දක්වන ලදී. පාලි වියරණ ඇදුරෝ උපචාරය එකොළොස් වැදෑරුම් කොට ද තෙළෙස් වැදෑරුම් කොට ද දැක්වූහ. පැරණි අර්ථවිචාරකයන් උපචාරය ද විශේෂාර්ථ ජනක කරුණක් සේ සැලකූබව පෙනේ. පාලි වියරණ ඇදුරන්ගේ තෙළෙස් වැදෑරුම් උපචාරය පැවසෙන

''සාමීප්පෙනෙක භෙදෙන සහිතට්ඨාන පායිකා
තද්ධම්මභෙද ගුණතො ඵලතාදත්‍ථ සාදිසා
සම්බන්ධෙනොපමෙය්‍යෙනොපචාරා හොන්ති තෙරස''

යන ගාථා පංචිකාප්‍රදීපයෙහි[98] ලා රහල් හිමියෝ උපුටා දක්වති. ලක්දිව වියරණ ඇදුරන් අර්ථප්‍රතීතිය ප්‍රමුඛ කොට ඇති ව්‍යාකරණයේ දර්ශනාත්මක පක්ෂයට විශේෂ සැලකිල්ලක් දැක්වූ බව පැහැදිලිය. රූපසිද්ධි, පයෝග සිද්ධි, මොග්ගල්ලාන පංචිකා, පදසාධන ආදී පදරූප සිද්ධිය ඉගැන්වීමට මුල්තැන දුන් ග්‍රන්ථයන්හි පවා අර්ථවිචාරාත්මක කරුණු විමසීමට වැදගත් තැනක් ලැබෙන අතර, සම්බන්ධ චින්තා සද්දසාරත්ථජාලිනී, සද්දත්ථභෙද චින්තා, වාචකොපදේස, කාරක පුප්ඵමඤ්ජරි අර්ථවිචාරය ඇතුළු ව්‍යාකරණ දර්ශනයට මුල්තැන දුන් ග්‍රන්ථ රාශියක් බිහිව ඇත්තේ එහෙයිනි. වුත්තොදය හා සුබොධාලංකාරය ලිවීමෙන් විශිෂ්ට කාව්‍යලක්ෂණාචාර්‍ය්‍යවරයකු වශයෙන් ප්‍රසිද්ධියට පත් සංඝරක්ෂිත හිමියන්ගේ කෘතියක් වන සම්බන්ධචින්තාවෙහි සංස්කෘත ව්‍යාකරණ දර්ශනය පිළිබඳ උසස්තම කෘතිය සේ සැලකෙන වාක්‍යපදීයේ ආභාසය පැහැදිලිව ම දක්නට ලැබෙන අතර සෙසු පොත්වල ද වැඩි අඩු වශයෙන් එම බලපෑම දක්නා ලැබේ.

4.31 මෙරට ලියවුණු පාලි වියරණ පොත් වලින් වැඩිහරියක් අයත් වන්නේ පොළොන්නරු සමයට හා ඉන් මෑත සියවස් දෙකතුනටය. පොළොන්නරු සමය ලක්දිව සංස්කෘත පාණ්ඩිත්‍යයේ උච්චතම කාලපරිච්ඡේදය විය. එම යුගයේ සිටි දිඹුලාගල පරපුරේ භික්ෂූන් ඇතුළු ග්‍රන්ථකාරක බෞද්ධපඬිවරු හැම දෙනා ම පාහේ දර්ශනාන්තර සහිත සංස්කෘත භාෂා සාහිත්‍යයෙහි පාරප්‍රාප්තයෝ වූහ. සකු වියරණයේ චාන්ද්‍රසම්ප්‍රදය කෙරෙහි වැඩි අභිරුචියක් ඔවුන් තුළ වූ නමුදු පාණිනී සම්ප්‍රදයයෙහිද ඔවුන් පැයේ අද්විතීය වෛශාරද්‍යයකි. දිඹුලාගල කාශ්‍යප සංඝරාජයන්ගේ බාලාවබෝධනයත්, ශාරිපුත්‍ර හිමියන්ගේ චාන්ද්‍ර පංචිකාලංකාරයත් මෙකල ලියවුණු චාන්ද්‍ර සාම්ප්‍රදයික සංස්කෘත ව්‍යාකරණ ග්‍රන්ථවන අතර, ධර්මකීර්තිපාදයන්ගේ රූපාවතාරය පාණිනී සම්ප්‍රදයයට අයත් සකු වියරණයක් වෙයි. මෙකල ලක්දිව විසූ ග්‍රන්ථකාරක භික්ෂූන් වහන්සේලාගේ පාණ්ඩිත්‍යය කෙබඳුද යන්න පිළිබඳ ඉඟියක්, අභිධර්මාර්ථසංග්‍රහ පුරාණ සන්නයේ අවසානයෙහි යොද ඇති ශාරිපුත්‍ර හිමියන්ගේ පාණ්ඩිත්‍යය සම්බන්ධව පැව සෙන පහත සඳහන් ගාථාවෙන් ලබාගත හැකිය:—

''යං චන්දේ චන්දගූනං නිසිතතරමතිං පාණිනිං පාණිනීයෙ
සබ්බස්මිං තක්කසඤ්ඤෙ පටුතරමතයො කත්තුභූතංච තං තං
මඤ්ඤන්තෙ කාලිදසං කවිජනහදයානන්දහේතුං කවිත්තෙ
සායං ලෝකත්ථසිද්ධිං විතරතු රචනා තස්ස සාරිපුතස්ස''.

[අතිශය තියුණු නුවණැති යම් තෙරනමක් චාන්ද්‍රව්‍යාකරණ විෂයෙහි එහි කර්තෘ වූ චන්ද්‍රගොමීහු වැනියයිද, පාණිනීයව්‍යාකරණ විෂයෙහි පාණිනිහු වැනියයි ද සකල සාම්ප්‍රදයික තර්කශාස්ත්‍ර විෂයෙහි ඒ ඒ කෘතීන් කළ (ගෞතම, කණාද, කපිල පතංජලි ජෛමිනි ව්‍යාස යන) මුනිවරුන් වැනියයි ද, කවිත්ව විෂයෙහි කවිජන හෘදයානන්දකර වූ කාලිදසයන් වැනියයි ද කියා ලොව බුද්ධිමත්හු සලකත් නම් එබඳු වූ ඒ ශාරිපුත්‍රයන්ගේ රචනාව ලෝකාර්ථසිද්ධිය කෙරේවා.] ශාරිපුත්‍ර හිමියන් අප්‍රතිම වියරණ ඇදුරකු, තාර්කිකයකු මෙන්ම කවියකු ද වශයෙන් ප්‍රසිද්ධියට පත්ව සිටිබව මෙයින් පෙනේ.

4. 32 ශාරිපුත්‍ර හිමියෝ ඉහතකී සුබෝධාලංකාර නම් පාලිකාව්‍යශාස්ත්‍රීය ග්‍රන්ථය කළ සංඝරක්ෂිත හිමියන්ගේ ද ගුරුවරුන්ගෙන් කෙනෙක් වූහ. සංඝරක්ඛිත හිමියන්ට කාව්‍ය ශාස්ත්‍රයෙහි පමණක් නොව ඡන්දශ්ශාස්ත්‍රයෙහි හා ව්‍යාකරණ ශාස්ත්‍රයෙහිද

සුවිශද දැනුමක් වූ බව උන්වහන්සේ ලියූ වුත්තෝදය නම් පාලි ඡන්දෝග්‍රන්ථයෙන් හා මුගලන් වියරණයට ලියූ සුසද්දසිද්ධි නම් ටීකාවෙන්ද 'සම්බන්ධචින්තා' නම් වූ ව්‍යාකරණ දර්ශනය පිළිබඳ පාලි ග්‍රන්ථයෙන් ද ස්ඵුට වෙයි.

4.33 පොළොන්නරු යුගයෙහි විසූ ගිහිපැවිදි දෙපසටම අයත් බොහෝ ගත්කරුවන් සංස්කෘත බෞද්ධ ධර්මයෙහි ද තර්කන්‍යායෙහිද ප්‍රවීණයන් වූ බව බෝධිවංශ ගැටපදය පිළිබඳව කළ සාකච්ඡාවේදී සඳහන් කොට ඇත. මේ යුගයේ ගිහි පඬිවරුන්ගේ පෘථුල ග්‍රන්ථාන්තර ඥානය පිළිබඳ වඩාහොඳ නිදසුනකි ගුරුළු ගෝමීන්ගේ ධර්මප්‍රදීපිකාව. එයට කරුණු උපුටා ගත් බෞද්ධ සංස්කෘත පොත් වලින් සමහරක් මෙකල අභාවප්‍රාප්තය. මෙහි එන උද්ධෘතපාඨ අතුරෙන් අර්ථවිචාරය පිළිබඳව දැක්වූ විශේෂ සැලකිල්ල පෙන්වන නිදසුනකි 'ඒව' ශබ්දයේ අර්ථවිවරණය කරමින් ධර්මකීර්ති පාදයන්ගේ ප්‍රමාණවාර්තිකයෙන් ගත් ''අයෝගං යොගමපරෛඃ''යනාදි ශ්ලෝක චතුෂ්කය. පංචිකාප්‍රදීපය ද එම ශබ්දර්ථ දක්වා ඇත්තේ ඒ අනුවයි.[99] දඹදෙණි පැරකුම්බාවන්ගේ විශුද්ධිමාර්ග සන්නයෙහි ද ධර්මකීර්ති මත ගෙනහැර දක්වා තිබේ. කෝට්ටේ යුගය වන තෙක්ම ලක්දිව ඇදුරන් ධර්මකීතිපාදයන්ට දැක්වූ ගෞරවය හීන නුවූ බව රහල් හිමියන් පංචිකාප්‍රදීපයෙහි ලා ''සකලතාර්කිකචක්‍ර චූඩාමණි''[100] යන විශේෂණය උන් වහන්සේ වෙත පිරිනැමීමෙන් පෙනේ. දිඞ්නාගද මේ රටේ පඬිවරුන්ගේ ගෞරවය දිනාගත් බෞද්ධතාර්කිකයකු වූ බව පැරකුම්බා සිරිතේ ''විනයසුතබිදම් සසමය තකුසත දිඞ්නාග පාද''[101] යන රජ වැනුමෙන් පෙනේ. නාගාර්ජුන, නාගබෝධි, වසුබන්ධු, රත්න ශ්‍රී ඥාන, ජිනේන්ද්‍ර බුද්ධි, ශාන්තිදේව ආදි බෞද්ධ දර්ශනිකයන්ගේ මතද ධර්ම ප්‍රදීපිකා විශුද්ධිමාර්ග සන්න ආදියෙහි සුලභ ලෙස දක්නා ලැබේ. නිකායාන්තර මත ගෙන හැර දැක්වීමේ දී විශුද්ධිමාර්ග සන්න කතුවරයාට මාර්ගදේශක වී ඇත්තේ ධර්මපාල තෙරුන්ගේ විසුද්ධිමග්ග ටීකාවයි.

5.1 ලක්දිව අර්ථව්‍යාඛ්‍යාන කාරයන් මහත් සැලකිල්ලක් දැක්වූ අභිධෙයාර්ථ (වාච්‍යාර්ථ) උපචාරාර්ථ (ලක්ෂණාර්ථ) පිළිබඳ විවරණත්, නිරුක්ත්‍යර්ථ හා කාරකාදි විවිධ ව්‍යාකරණාර්ථ පිළිබඳ විවරණත්, පළමුකොට ම නෛරුක්තික – වෛයාකරණික යන්ගේ සහ විවිධ සම්ප්‍රදායායත්ත බෞද්ධාබෞද්ධ තාර්කික–දර්ශනිකයන්ගේ විෂය ක්ෂේත්‍රයක් විය. භාරතීය අර්ථවිචාර (අර්ථාපත්ති) සංවාදයට සහභාගී වූ පැරණි තාර්කික දර්ශනිකයෝ හැමදෙනම පාහේ වෛයාකරණිකයෝ ද වූහ. කාත්‍යායන, පතංජලී, ජෛමිනී, චන්ද්‍රගෝමින්,භර්තෘහරි, ධර්මකීර්ති ආදීන් මෙනි. ආලංකාරිකයන් හෙවත් සාහිත්‍ය ශාස්ත්‍රීය ආචාර්යවරුන් අර්ථප්‍රතීතිය පිළිබඳව මුලදී තියුණු සැලකිල්ලක් නොදැක්වූ බව භරතගේ ඒ සා සාරාර්ථ ගර්භ වූ රස විවරණ සූත්‍රය[102] පවා මනෝභාවාත්මක සියුම් විග්‍රහයකට භාජන කිරීම කලක් ගතවන තුරු ම අමතක කර දැමීමෙන් පෙනේ. එහෙත් 9 වන සියවසේ ආරම්භයෙහි පමණ පටන් අර්ථප්‍රතීති ස්වභාවය පිළිබඳවත් කාව්‍යයක ආස්වාදන ස්වභාවය පිළිබඳවත් කාව්‍යවිචාරකයන්ගේ අවධානය යොමු වන්නට වූ සැටි ධ්වන්‍යාලෝක කාරිකාවෙහි පටන් ලියවී ඇති හෘදය දර්පණ, ශෘඞ්ගාර ප්‍රකාශ, වක්‍රෝක්තිජීවිත, ව්‍යක්ති විවේක, ඖචිත්‍ය විචාර චර්චා, අලංකාර සර්වස්ව කාව්‍ය ප්‍රකාශ, කාව්‍ය මීමාංසා, ධ්වන්‍යාලෝක ලෝචන, චන්ද්‍රලෝක, වාග්භටාලංකාර සාහිත්‍ය දර්පණ වැනි කෘතිවලින් හෙළිවේ. සාහිත්‍යාස්වාදය පිළිබඳ මෙම නව චිත්ත ප්‍රවාහයේ චින්තනධාරාවන් අතුරෙන් ඉතා වැදගත් තැනක් ගන්නා වාච්‍යාර්ථ ව්‍යංග්‍යාර්ථ ප්‍රතීතිමූලක රසාස්වාද විභාගය හා සම්බන්ධ වූ මූලික ඉගැන්වීම් 10 වන සියවස වන විට ලක්දිව කරාත් ව්‍යාප්තව තිබුණු බව සියබස් ලකරේ ''පෙනෙනත් අත් බෙලෙන්– එන අරුත ද සදතු දෙක'' යනාදි කියමන ගැන ඉහත කළ සාකච්ඡාවෙන් පැහැදිලි වන්නට

ඇත. රස–ධ්වනි–වක්‍රොක්තිවාදයන් විශේෂයෙන් ම කාව්‍යොක්තියේ අර්ථප්‍රතීති ස්වභාව විභාගය මත ගොඩනැගී ඇති නිසා බෞද්ධාබෞද්ධ දර්ශනාන්තර අධ්‍යාපනයට කේන්ද්‍ර ස්ථානයක්ව පැවති ලක්දිව පඬිවරුන් එකී විචාර චින්තාවන් පිළිබඳව උනන්දුවක් දැක්වීම ස්වාභාවිකය. සිංහල අර්ථව්‍යාඛ්‍යානයන්ගෙන් උපුටා යට දැක්වූ නිදසුන් සමහරක ද එම උනන්දුව ප්‍රතිබිම්බිතව දැක්ක හැකිය.

5.2 වාච්‍යාර්ථ – ව්‍යංග්‍යාර්ථ විභාගය සාහිත්‍ය විචාරය සඳහා සාර්ථක ලෙස යොද ගත හැකිය යන අදහස දඹදිව කව් ලකුණැජරන් අතර පැතිර ගොස් වැඩි කලක් යන්නට මත්තෙන් සියබස්ලකරකරු එහි අගය වටහා ගත් නමුත්, වෙනත් ප්‍රායෝගික හේතු මත කාව්‍යාදර්ශය ගුරුතැන්හි ලා සැලකීමට සිදුවූ නිසාදෝ ඔහුගෙන් කාව්‍යරස විවරණයට ලැබී ඇත්තේ එතරම් වැදගත් තැනක් නොවේ. දණ්ඩින් අනුගමනය කරමින් අර්ථාලංකාර පන්තිසක් ගෙන හැර දක්වන ඔහු ඉන් එකක් වූ රසවත් නම් අර්ථාලංකාරය යටතේ භරතමුනි නම්කළ රස අට පැහැදිලි කිරීම උදෙසා දෙන නිදසුන් පැදි අටකට ඔහුගේ රස නිරූපණය සීමා කරයි.[103] එහෙත් ලක්දිව පඬිවරුන් සියබස් ලකරේ එම රස නිරූපණයෙන් තෘප්තියට නොපත් බවත් කාව්‍ය ශාස්ත්‍රීය ග්‍රන්ථාන්තර පරිශීලනයෙන් ස්වකීය රසඥානය දියුණු කර ගත් බවත්, ''නවනට්ට රසොපෙතං'' යන පාලි බෝධිවංස (10 සියවස) පාඨයෙන් මෙන්ම ගැටපදකරු (12 සියවස) එයට ලියූ අර්ථවිවරණයෙන්ද ස්ඵුට වේ. උද්භට (ක්‍රි. ව. 800 පමණ) ගේ කාව්‍යාලංකාර සංග්‍රහය, අග්නිපුරාණය (10 සියවස) වැනි කෘතීන්හි එන

''ශෘඞ්ගාර වීර බීභත්ස – රෞද්‍ර හාස භයානකාඃ
කරුණාද්භුත ශාන්තාශ්ච – නව නාට්‍යෙ රසාඃස්මෘතාඃ''

යන ශ්ලෝකය ද උදුරා දක්වමින් මෙහිදී ගැටපද කරු නවනාට්‍ය රසය හඳුන්වා දෙන්නේ.[104] පැරණි රස අටට නවවන ශාන්තරසයක් එක් කරන ලද්දේ වාසුකී විසින්ය යන පිළිගැනීමක් උගතුන් අතර වූබව පවසන භාවප්‍රකාශන කාර සාරදතනය (13 සියවස) එය රසයක් වශයෙන් පිළිගැනීමට මැලි වන නමුත් කාව්‍යකෞතුකකාර භට්ට තෞත (10 සියවස) එය සර්වරසයන්ගෙන් විශිෂ්ටතම වූ රසය බව පවසයි. තෞත අභිනව ගුප්තගේ ගුරුවරයාය. රස අටක් දැක්වූ භාරතගේ නාට්‍යශාස්ත්‍රයට අභිනව භාරතී නම් ටීකාව කළ අභිනව ගුප්ත ඇතුළුව ආනන්දවර්ධන, රුද්‍රට, රුද්‍රභට්ට, භෝජ, මම්මට, ජයදේව ආදී ප්‍රසිද්ධ කාව්‍යානුශාසකයන් බොහෝ දෙනකු බෝධිවංශ ගැටපද යුගය වන විට රස අටක්මය යන මතය ප්‍රතික්ෂෙප කොට තිබුණු අතර ඉන් වැඩි දෙනා පිළිගෙන තිබුණේ ඉහත කී රස නවයක් ය යන මතයයි.

5.3 කාව්‍යය සම්බන්ධයෙන් 'ශමය' ස්ථායී භාව කොට ඇති ශාන්ත රසයාගේ ස්වීකාරයට බෞද්ධ කවිසම්ප්‍රදය හා විචාර සම්ප්‍රදය ද උපස්තම්භක වන්නට ඇතැයි සිතිය හැකිය. බෞද්ධ දර්ශනිකයකු හා උසස් කවියකු වූ අශ්වඝෝෂ (ක්‍රි.ව. 1 සියවස) ගේ සෞන්දරනන්ද කාව්‍යය ශෘංගාරාදි වර්ණනයන්ගෙන් අවිනිර්මුක්ත නමුත් එය අවසන් වන්නේ ශාන්තරසය කුළුගන්වමිනි. ඔහු සිය කෘතිය අවසන් කරමින් පවසන

''ඉත්‍යෙෂා ව්‍යුපශාන්තයෙ න රතයෙ මොක්ෂාර්ථගර්භා කෘතිඃ
ශ්‍රොතෲණාං ග්‍රහණාර්ථමන්‍ය මනසාං කාව්‍යොපචාරාත් කෘතම්
යන් මොක්ෂාත් කෘතමන්‍යදත්‍ර හි මයා තත් කාව්‍යධර්මාත් කෘතං
පාතුං තික්තමිවෞෂධං මධුයුතං හෘද්‍යං කථං ස්‍යාදිති''[105]

යන පද්‍යයෙන් ද ඒ බව ප්‍රකට වේ. (නොයෙක් බැහැර දෙයෙහි යොදවන ලද සිත් ඇති ශ්‍රොතෲන් ඇද බැඳ තබා ගැනීම පිණිස කාව්‍යමය උපක්‍රමයෙන් කරන ලද මොක්ෂාර්ථ ගර්භ වූ මෙම කෘතිය චිත්ත ශාන්තිය සඳහා මිස අභිරතිය සඳහා නොවෙයි. මොක්ෂාර්ථයෙන් බාහිර වූ යම් වර්ණනාදියක් මෙහි ඇත්නම් කාව්‍යධර්මානුකූලව එසේ කරන ලද්දේ බීමට රුචිය ඇති කරනු සඳහා තිත්ත බෙහෙතකට මී පැණි මිශ්‍ර කරන්නාක් මෙනි.) බුද්ධචරිතය වස්තු කොට අශ්ව ඝොෂයන් විසින් ම රචිත වූ බුද්ධචරිත නම් කාව්‍යයෙහි ද බුද්ධඝෝෂයන් (5 සියවස) විසින් රචිත පද්‍යචූඩාමණියෙහි ද මෙම ලක්ෂණය ප්‍රකටව දක්නට ඇත. ශ්‍රී හර්ෂප්‍රණීත නාගානන්දය (7 සියවස) බෞද්ධ කථාවක් වූ ජීමූත වාහන ජාතකය වස්තු කොට ගත් ශාන්තරස ගර්භ වූ දෘශ්‍ය කාව්‍යයකි. නාගානන්දයෙන් උපුටා ගත් පාඨ බෝධිවංශ ගැටපදයෙහි ද දක්නා ලැබේ.[106]

5.4 සියබස්ලකරින් පසුව, සිංහල කවීන් ලියූ පැරණි ගීකව් තුනෙන් දෙකක — එනම් මුවදෙව්දවතෙහි හා සසදාවතෙහි —, කතුරුවන්ගේ අභිලාෂය වූයේත් ශාන්තරසය තුළු ගැන්වීම බව කල්පනා කළ හැකිය. සියබස්ලකර ශාන්තරසය නම් විසින් සඳහන් නො කළ ද පද්‍ය කාව්‍යය සඳහා බුදුසිරිත් (=බෝසත් සිරිත්) වස්තු කර ගැනීම ලක්දිව කවීන්ගේ සම්ප්‍රදයක් බවට පත්වීමට තුඩු දෙන්නට ඇත්තේත් මෝක්ෂාර්ථගර්භතා සංඛ්‍යාත බෞද්ධ පරමාර්ථයට පිටුපෑහයි යන චෝදනාවට ලක් නොවී, කව් සිළුමිණි කවියා කළ පරිදි ශෘඞ්ගාරාදි රසජනක කාව්‍ය රචනයට වුවද නිදහසක් ඉන් ලැබෙන බව විශ්වාස කිරීමයි.

''රජ රුවන මන රහ – සිවුසැට බරණ හා ඇඟ
තේරී පෙනෙන රහ – පෙනේ කව්ලකර හා බණමහ''[107]

යනුවෙන් රහල් හිමියෝ ද අශ්වඝොෂාදීන් ගිය මග යමින් බණ මහ කව්ලකරින් රිසිසේ සරසන්නට ඉඩ ලබා ගනිති.

6.0 සියබස්ලකරින් හා බෝධිවංශ ගැටපදය වැනි ව්‍යාඛ්‍යාන ග්‍රන්ථ කීපයකිනුත් ලාංකික පඬිවරුන් ප්‍රධාන පාලි–සංස්කෘත ආලංකාරික – වෛයාකරණිකයන්ගේ කෘති කීපයකිනුත් ලබා ගත හැකි සාක්ෂ්‍ය වහල් කොට ගනිමින් මෙතෙක් අප කළ විමර්ශන යෙන් බැසගත හැකි නිගමන මෙසේ සම්පිණ්ඩනය කළ හැකිය; සංගත්‍යර්ථ එකීභාවාර්ථ සාහිත්‍ය ශබ්දයාගේ ප්‍රායෝගය පශ්චාත් සංහිතා යුගයෙහි සිටම සංස්කෘතයෙහි දක්නට ලැබුණ ද ගද්‍යපද්‍ය හා දෘශ්‍ය කාව්‍යවාචී සාහිත්‍ය ශබ්දයාගේ ප්‍රයෝගය සංස්කෘතයෙහි දක්නට ලැබෙන්නේ කාලිදස (5 සියවස ?) යුගයෙහි පමණ සිටය. කාව්‍ය ශාස්ත්‍රාර්ථයෙහි සාහිත්‍ය ශබ්දයාගේ භාවිතය දක්නට ලැබෙන්නේ රාජශේඛර (ක්‍රි.900?) යුගයෙහි පමණ සිටය. සිංහලයෙහි ද 12 වන සියවසේ පමණ සිට සාහිත්‍ය ශබ්දයාගේ ප්‍රයෝගය දක්නට ලැබෙතත්, කාව්‍යාර්ථයෙන් හෝ සකලවිධ නිබන්ධ සංඛ්‍යාත පෘථුලාර්ථයෙන් හෝ එය යොදන්නට පටන් ගැනෙන්නේ 13 වන සියවසේදී හෝ ඉන් පසුවය. එහෙත් 15 වන සියවසේ පටන් කාව්‍යාර්ථයෙහි මෙන්ම කාව්‍යශාස්ත්‍රාර්ථයෙහි ද සාහිත්‍ය ශබ්දයාගේ ප්‍රයෝගය වැඩිවැඩියෙන් ප්‍රචලිත විය.

ලක්දිව සාහිත්‍ය ශාස්ත්‍ර සම්ප්‍රදය සියබස්ලකර ලිවීමට බොහෝ කලකට පෙර ඇරඹුණකි. සියබස්ලකර ලිවීමෙන් පසු, කාව්‍යශාස්ත්‍රීය අධ්‍යාපනයේ මූලික පාඨ්‍ය ග්‍රන්ථයක් වශයෙන් කාව්‍යාදර්ශය මෙන්ම එයද බොහෝ කලක් ජනප්‍රියව පැවැත්තේය. එහෙත් බෞද්ධ දර්ශනික – වෛයාකරණික ආලංකාරිකයන් නිසා ප්‍රභාවිත

වූ ලක්දිව සාහිත්‍යශාස්ත්‍ර සම්ප්‍රදය, සියබස්ලකරේ හා කාව්‍යාදර්ශයේ ඉගැන්වීම් වලින් කිසිසේත් තෘප්තියට පත් නොවූ අතර, විවිධ භාරතීය සම්ප්‍රදයයන් ඇසුරුකිරීමටත්, ඒවායින් ගතයුතු දෑ උකහා ගැනීමටත් තරම් චින්තාමය නිදහසින්, සුබනම්‍යතාවෙන් හා බුද්ධිප්‍රබෝධයෙන් ද යුක්ත විය. මේ තත්ත්වය, 16 වන සියවසේදී පමණ සිට ලක්දිව බෞද්ධ අධ්‍යාපනයේත් සිංහල සාහිත්‍යයේත් පිරිහීම පටන් ගන්නා තුරුම පැවති බව පෙනී යයි.

## අධෝ ලිපි

1. Ruyyaka's **Sahitya** Mimamsa, Trivandram Sanskrit Series No.114, p. 12; Ruyyaka's Alamkara Sarvasva with Jayaratha's Commentary, Kavya Mala Series, 35, Bombay, 1939, 1-2 ප්‍රකරණ ද බ.
2. Bhoja's Srngaraprakasa, Ed. V. Raghavan, Madras, 1963, pp. 87-88.
3. Bhartrhari's Subhasita Sangraha, ed. Prof. D. D. Kosambi, 75 පද්‍යය බ.
4. Bhoja's Srngaraprakasa, Ed. Raghavan, VIII පරිච්ඡේදය බ.
5. දහම් සරණ කි. ඥාණවිමල සං., ගුණසේන සහ සමා., කොළඹ, 1965, 38 පිට
6. ඩී.බී.ජයතිලක, සිංහල සාහිත්‍ය ලිපි, කොළඹ, 1940, "4. පණ්ඩිත පරාක්‍රමබාහු මහරජාණෝ" 63 පිට (කඳවුරුසිරිත.) බ.
7. කුවේණි සිහබා දඹදෙණි අස්න, කි. ඥාණවිමල සං., ගුණසේන සහ සමාගම, කොළඹ,1960,31 පිට.
8. දළද පූජාවලිය, ව. මේධානන්ද සං., ශ්‍රී ලංකා ප්‍ර. සමා., කොළඹ, 1957, 66 පිට.
9. නිකාය සංග්‍රහය, වෙ. අමරමෝලි සං., අභය ප්‍රකාශකයෝ, කොළඹ, 1955, 26 පිට.
10. සද්ධර්මරත්නාකරය, ක. දේවානන්ද සං., රත්නාකර පොත්., කොළඹ, 1955, 314 පිට.
11. රාජරත්නාකරය; පී. ඇන්. තිසේරා සං., ලංකාභිනව විශ්‍රැතය., 1929, 37 පිට.
12. නිකාය සංග්‍රහය, 28 පිට.
13. සද්ධර්මරත්නාකරය, 315 පිට.
14. රාජරත්නාකරය 38 පිට.
15. පැරකුම්බා සිරිත, ඩී. ජී. අභයගුණරත්න සං., ලංකාභිනව විශ්‍රැතය., 1944, 76 පද්‍යය.
16. සිරිරහල් පබඳ ඊ. තෙන්නකෝන් සං., ගුණසේන සහ සමාගම, කොළඹ, 1957 'පංචිකා ප්‍රදීපය' 226 පිට.
17. ගිරාසංදේශ විවරණය, කුමාරතුංග මුනිදාස සං., අනුල මු., මරදාන, 1953, 218–227 සහ 233–247 පද්‍ය.
18. හංසසංදේශ වර්ණනාව, ඩබ්. එෆ්. ධර්මවර්ධන සං., ගුණසේන සහ සමාගම, කොළඹ, 1953 170–181 සහ 184–197 පද්‍ය.
19. සිරිරහල් පබඳ, ඊ. තෙන්නකෝන් සං. 'කවිසේකරය' V සග 27–38 පද්‍ය.
20. P. V. Kane, History of Sanskrit Poetics, Delhi etc., 1961, p. 103; V.Varadacari, History of Sanskrit Literature, Allahabad, 1952, p. 180; K. A. N. Sastri, History of South India, Oxford University Press, Madras, 1955, p. 376.
21. K. A. N. Sastri, History of South India, pp. 332; 363-4. (දෙමළ සන්නයක් ද ඇත.)
22. Ibid. p. 378.
23. Ibid. p. 332; A. B. Keith, History of Sanskrit Literature, Oxford Univ. Press, London 1920, pp. 296 f; A. A. Macdonell, History of Sanskrit Literature, Delhi, 5th ed. 1958 p. 332, ජ. තිලකසිරි, සංස්කෘත කාව්‍ය සාහිත්‍යය, කොළඹ, 1961, 182–3 පිටු, වෙනස් මත සඳහා බ. S. N. Dasgupta. Sk. Dev. History of Sanskrit Literature, Vol. I, Univ. of Calcutta, 1947, pp. 531 f. F.N.1.
24. L. D. Barnett, "Alphabetical Guide to Sinhalese Folklore from Ballad Sources" IA, XLV, 1917; JRAS, 1905.
25. මෙයද සසඳන්න. "Both Dandin and Bhamaha are very early writers and are always referred by later writers...." S N. Dasgupta, op. cit. p. 531.
26. දේ ආදී ඇතැම් පඬිවරු භාමහ දණ්ඩින්ට වඩා පූර්වතරය යි පවසති: S. K. De, Studies in the History of Sanskrit Poetics, Calcutta, (2 parts) 1923 and 1925, p. 49. ඊට විරුද්ධ තර්ක සඳහා A. B. Keith, op. cit, Ch. XIV. "The Age and Works of Dandin, pp. 296-7; S. N. Dasgupta, op. cit., pp. 531-2 (V. Raghavan,opcit."Bhoja and Bhamaha Dandin and Vamana, pp. 674-82 ද කියවන්න.)
27. සියබස් ලකර ඥාණතිලක – ඥාණසීහ සං., කොළඹ 1933, 15–19 ගී
28. Natya Sastra of Bharata, Kasi Sanskrit Series, Benaras, 1929, I
29. Kavya Mimamsa of Rajasekhara, ed. C. D. Dalal and R. A. Sastry, GOS, Baroda, 1934, ප්‍රථමාධිකරණය, තෘතීයාධ්‍යාය (5–10 පිටු) එම (Explanatory Notes on p. 6, Note 1-2 (p.139-40) දබ.
30. ඉහත 19 සටහන බ.

31. 1 සහ 75 පද්‍යය.
32. සිරිරහල් පබඳ උක්ත සං., 225 පිට.
33. ගිරා සංදේශ විවරණය, උක්ත සං., 240–41 පද්‍ය
34. Kavyadarsa of Dandin with the Hrdyangama Com., Ed. M. Rangacharya, Madras, 1910,
35. S. N. Dasgupta, op. cit. p. 521.
36. Abhinavabharati of Abhinavagupta, Gaekwad's Oriental Series, Baroda, Vol. I. 1926
37. පාණිනී: අෂ්ටාධ්‍යායී සූත්‍රපාඨ, iv 3,110 සූත්‍රය බ.
38. කාව්‍යාදර්ශය, (පූර්වාචාර්‍යවිරප්‍රණීත ව්‍යාඛ්‍යාන සහිත), ධර්මාරාම සං., සත්‍ය සමුච්චය, 1925, 2, පද්‍යය යටතේ බ.
39. එම II 2 පද්‍යය යටතේ බ.
40. සුබෝධාලංකාරය (ශ්‍රී සංඝරක්ෂිත ස්වාමිපාද ප්‍රණීත), ලංකානන්ද සං, හොරණ, 1937 I 2, පද්‍ය බ.
41. S. N. Dasgupta, op. cit. p. 762.
42. Kavyalamkara of Bhamaha, Kasi Sanskrit Series, 1928, II, 9. කාරිකා; II. 58. කාරිකාව ද. බ.
43. V. Varadacari, op. cit., p. 181.
44. Ibid. p. 180.
45. Kavyalamkara, II 39-40 කාරිකා.
46. Ibid. II. 88 කාරිකා.
47. "යතො මේධාවිරුද්‍ර කුමාරදාසාදයඃ ජාත්‍යන්ධාඃ කවයඃ ශ්‍රූයන්තෙ" Kavya Mi. op. cit., p. 12; S. N. Dasgupta, op. cit. pp. 763-4.
48. පැරකුම්බා සිරිත, උක්ත සං., 23 පද්‍යය; "ඇජර කිවියර පිනින් ජානකිහරණ ඇ මහ කව් බැඳි කුමරදස් රද කාලිදස් නම් කිවිඳු හට සියදිවි පිදි."
49. Kavyalamkara of Rudrata with the Commentary of Namisadhu, Kavya Mala Series 2, 1928. S. N. Dasgupta, op. cit. p. 531 (F. N. 1)- 532; Ibid. p. 525 (F.N. 1).
50. Kavyamimamsa, op. cit.
51. සියබස්ලකර, උක්ත සං., 15–19 ගී.
52. එහි ම 20 ගීය.
53. කව්සිළුමිණ (පැරණි සන්න සහිත) ඇම්. බී. ආරියපාල සං., ගුණසේන සහ සමාගම කොළඹ 1965, I. 4 පද්‍යය.
54. සියබස්ලකර, 338 පද්‍යය.
55. එහිම 397–99 පද්‍ය
56. Dhvanyaloka of Anandavardhana, with Locana of Abhinavagupta, Kavya Mala Series, 1928, I. 9 කාරිකා.
57. හෙ. ජයතිලක සං., (1932); පො. සුදර්ශී සං. (1927); ඥාණතිලක- ඥාණ සීහ සං., (1933); G. P. Malalasekera, Pali Literature (1928) p. 167-8; ඩී. ඊ. හෙට්ටිආරච්චි වෙසතුරුද සන්න, (1950) ප්‍ර. 18.; M. B. Ariyapala, Society in Med, Cey.(1956) p. 21; මාර්ටින් වික්‍රමසිංහ සාහිත්‍යෝදය කථා (1960), 14 පිට.; පූ. බී. ජයසේකර, සිංහල ගී කාව්‍ය. (1962) 217 පි.; පී. බී. සන්නස්ගල, සිංහල සා. වංශය (1964 61-2 පි.; කො. පඤ්ඤාකිත්ති, සාහිත්‍ය කථා (1950) 1–8 පි. සහ P. V. Kane, op. cit. p. 100; M. D. Raghavan, India in Cey. Hist. (1964), p. 82; A. M. Ghatage, Historical Ling. (1962), p. 132; සහ තවත් අය.
58. අ. සැබිහෙළ සං. (1963); ආ. කුලසූරිය, සිංහල සාහි. (1961), 218–9 පිටු; අ. සෙනෙවිරත්න සිංහල ගී කාව්‍ය සංග්‍රහය (1967) 6 පිට
59. සිරිනිවාස–ධම්මසේන – ධම්මින්ද සං. (1948); S. Paranavitana, UCHC I (1960) p. 395;
60. P. V. Kane, op. cit. ; S. N. Dasgupta, op. cit. p. 543 (F.N. 1); Ibid p. 540f.(F.N1.)
61. Dhvanyaloka, I. කාරිකා.
62. සියබස්ලකර 398 පද්‍යය.
63. එහිම 399 පද්‍යය
64. K. K. Raja, Indian Theories of Meaning, Adyar, Madras, 1963, Ch. 7.; ජී. එච්. විජේවර්ධන කාව්‍ය විචාර ගවේෂණ, කොළඹ, 1968 "ගම්‍යමාන අදැඹක්..." 158 පි. සිට ද. බ.
65. සියබස්ලකර, 3 පද්‍යය
66. සිදත් සඟරා, සිජකඩුවේ ශ්‍රී සුමංගල සංහි., ජිනාලංකාර කොළඹ 193 පි.
67. සුබෝධාලංකාර, උක්තසං., 338–39 පද්‍ය
68. මහාබෝධිවංශ ග්‍රන්ථපද විවරණය, ශ්‍රී ධර්මාරාම සං, ලංකා බෞද්ධ මණ්ඩලය, 1957, 124–25 පි.
69. එහිම 125 පිට.
70. S. N. Dasgupta, op. cit. p. 560.
71. Candraloka of Jayadeva, Nirnayasagara, Bombay, 1917.
72. V. Raghavan, Some Concepts of Alamkara Sastra, Madras, 1942.
73. Kavyamimamsa, op. cit. X අධ්‍යාය (41 පිට)

74. දීඝනිකායො, සීලක්ඛන්ධවග්ග, 3 සූත්ත, සොමාලෝක තිස්ස සං. 1954, 62 පිට
75. සුමංගල විලාසිනී නාම දීඝනිකායට්ඨ කථා හේවාවිතාරණ ත්‍රිපිටක මු., 1918, 173 පිට.
76. අභිධානප්පදීපිකා, ඥාණෝභාස තිස්ස සං., 1929, 115 පද්‍ය
77. සාරත්ථදීපනී ටීකා; සිරිදේවරක්ඛිත සං., I, 1914
78. විමතිවිනෝදනී ටීකා, සිරි ධම්මාධාර සං., 1935
79. සිංහල බෝධිවංශය, අමරමෝලි සං: කොළඹ, 1951, 153 පි.
80. Lalita Vistara, ed. R. L. Mitra, ch. XII, p. 199-200.
81. Kama Sutra of Vatsyayana, Kasi Sanskrit Series, 1929, I, iii, 16; V. Raghavan, Bhoja Srngara Prakasa, ch. XXIV (pp. 660-64) කාමසූත්‍ර ජයමංගලා ව්‍යාඛ්‍යා හා ශෘඞ්ගාර ප්‍රකාශ (xvi පරි.) චතුඃෂ්ටි කලා නාමමාලා තුලනය සඳහා බ.
82. පූජාවලිය, වලානේ ශ්‍රී සිද්ධාර්ථ සං., ජිනාලංකාර, 1951, 135 පිට.
83. සද්ධර්මාලංකාරය, ක, සාරානන්ද සං., රත්නාකර 1953, 87–8 පිට
84. සූසැට කලා නාමාවලී තුලනයක් සඳහා M. B. Ariyapala, op. cit. pp. 273-277; V. Raghavan, op. cit. pp. 600-664; N. A. Mazumder, History of Education in Ancient India Calcutta etc., 1916, pp. 116-120.
85. මහාබෝධිවංශ ග්‍ර. වි. 39 පිට
86. Brhaddevata of Saunaka, ed. A. A. Macdonell, Harvard Oriental Series, 1904, II, 108.
87. Vakyapadiya of Bhartrhari, with Com. of Punyaraja, Benaras, 1905, II, 316.
88. අභිධර්මාර්ථ සංග්‍රහය, ශ්‍රී සාරිපුත්‍ර සංඝරාජ ... විරචිත සන්න සහිත, පඤ්ඤාමෝලි තිස්ස සං., 1916. 9 පිට.
89. ප්‍රයෝග සිද්ධි, දුතිය ඛණ්ඩ අකාරාන්ත නාම සිද්ධි අවසන්හි බ. [කෝ. ඥාණාලෝක හිමියන්ගේ සංස්කරණයක් ලෙසදී ප්‍රකාශිත ය]
90. සිරිරහල් පබඳ, උක්ත සං., 232 පිට.
91. Vakyapadiya, II. 217-18.
92. Kavyaprakasa of Mammata, with Com. of Manikyacandra, Mysore, 1922, III, 21-2
93. ධර්මප්‍රදීපිකා, ශ්‍රී ධර්මාරාම සං., 1938 28, පිට; පංචිකාප්‍රදීපය, රහලහිමි පබඳ., 256 පිට විශුද්ධි මාර්ග සන්න ශ්‍රද්ධාතිෂ්‍ය සං., 1949, vii 506 පිට
94. මහාබෝධිවංශ ග්‍ර.වි. 62 පිට.
95. Maha Bhasya of Patanjali, with Pradipa of Kayyata, Nirnaya Sagara, Bombay II, p. 218
96. ධර්මප්‍රදීපිකා 204 පිට
97. Nyayasutra of Gautama, with Vatsyayana's Bhasya, Chowknamba, 1920, II. 2.62.
98. සිරිරහල් පබඳ, 229 පිට.
99. ධර්මප්‍රදීපිකා 2–3 පිටු; පංචිකාප්‍රදීප, ඉහතකී 224–25 පිටු
100. එහිම 227 පිට
101. පැරකුම්බා සිරිත 77 පද්‍යය.
102. "විභාවානුභාව ව්‍යභිචාරි සංයොගාද්‍රසනිෂ්පත්තිඃ Natyasastra, VI අධ්‍යාය
103. සියබස් ලකර, 276–283 පද්‍ය
104. මහාබෝධිවංශ, ග්‍ර.වි. 41 පිට;
105. Saundarananda of Asvaghosa, ed. E. H. Johnston, Oxford Univ. Press, 1932, XVIII පද්‍යය V. Raghavan, The Number of Rasas, Madras, 2nd ed., 1967, p. 23f ද. බ.
106. "අමිශීතෛරශෙ භ්‍රෑමූබරිතලතා මණ්ඩප භූවඃ ......" මහා බෝධිවංශ ග්‍ර.වි. 138 පිට.
107. සිරිරහල් පබඳ, කැසෙකරය I – 26 පද්‍යය.